# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2015** මාර්තු **03** වන අඟහරුවාදා
2015 பங்குனி 03 செவ்வாய்க் கிழமை
Thuesday 03rd March 2015

බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුවමාවතේ, අංක **204** හි පිහිටි බස්නාහිර පළාතේ සභාගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.46 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.46 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.46 a.m.*

ගරු සභාපතිතුමා **[සුනිල් විජේරත්න මහතා]** මූලාසනාරූඪ විය.
*திரு .தவிசாளர் [சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [Sunil Wijerathne] in the Chair*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2015.02.19 වන දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව මම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that copies of the relevant report are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. මඩපාත, දම්පේ, 126/1 හි පදිංචි අවලා දිල්රුක්ෂි, පන්නිපිටිය, දෙපානම, අංක 245 හි පදිංචි කේ.පී.පී.කුමාරි සහ නිට්ටඹුව, කන්දගේනවත්ත 562/230/6 හි පදිංචි එස්.ඒ. සී. කුමාරි යන අයවලුන් විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම සහ

ii. කඩුවෙල, වැලිහිඳ පාර, 528/H හි පදිංචි එච්.ජී.ඩබ්ලිව්. ගුණරත්න යන අයගේ පෙත්සම.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, බොරලැස්ගමුව, නීලම්මහර, 164/B, එච්.ජී. තිලකසිරි යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 හා 02 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්න ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*The questions in the name of Hon.Lakshman Nipuna Arachchi, member, under item No. 01 & 2 of the agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for, it was ordered that the questions be referred to the next Council sitting.*

# උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා : V වන පළාත් සභාව විදේශ සංචාර
## HON. MINISTER UDAYA GAMMANPILA : FOREIN TOURS FIFTH PROVINCIAL COUNCIL

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**03.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරි මාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/15/03)**

අ. කෘෂිකර්ම, කෘෂි සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර ඇමැතිවරයා V - වන පළාත්

සහා කාලය තුළ විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් (ගරු උදය ගම්මන්පිල මැතිතුමා) තම ධූරයේ කටයුතු සඳහා විදේශගත වූ අවස්ථා ගණන කීයද?

ආ. විදේශ ගත වූ රට, කුමන දිනවලද? ඒ අනුව විදේශගතව සිටි දින ගණන කවරේද?

ඇ. එකී දිනයන්හි සහභාගි වූ වැඩ සටහන් කවරේද?

ඈ. අමාත්‍යවරයා සමඟ විදේශ සංචාරය වෙනුවෙන් සහභාගි වූ අනෙකුත් අය කවුරුන්ද?

ඉ. ඒ ඒ සංචාර සඳහා වැය කළ මුදල කොපමණද?

ඊ. සංචාරයන් සඳහා වැය කළ මුළු මුදල කොපමණද?

උ. ඒ ඒ සංචාර මගින් පළාත් සභාව වෙත ලැබුණු ප්‍රතිලාභ කවරේද?

ඌ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs.)

ආ.

- ඕස්ට්‍රේලියාව - 2009.11.12 සිට 2009.11.14 දක්වා දින 03
- මෙක්සිකෝව (කැන්කුන් නගරය) 2010.12.05 සිට 2010.12.12 දක්වා දින 08 යි.
- නෙදර්ලන්තය - 2011.05.18 සිට 2011.05.23 දක්වා දින 07
- චීනය - 2011.07.31 සිට 2011.08.08 දක්වා දින 09
- මියන්මාරය - 2011.10.10 සිට 2011.10.17 දක්වා දින 08
- චීනයේ ෂැංහයි - 2011.11.14 සිට 2011.11.19 දක්වා දින 06
- වියට්නාමය - 2012.02.21 සිට 2012.03.01 දක්වා දින 09
- බ්‍රසීලයේ රියෝද ජනයිරෝ නුවර - 2012.06.14 සිට 2012.06.27 දක්වා දින 14
- ඇමෙරිකා එක්සත් ජනපදය නිව්යෝක් නුවර - 2012.09.22 සිට 2012.10.01 දක්වා දින 10
- ඊජිප්තුව - 2013.02.28 සිට 2013.03.05 දක්වා දින 06
- සිංගප්පූරුව - 2013.09.19 සිට 2013.09.21 දක්වා දින 03
- පෝලන්තය වෝර්සෝ නුවර - 2013.11.18 සිට 2013.11.24 දක්වා දින 07

ඇ.

- ඕස්ට්‍රේලියාව - අධ්‍යයන චාරිකාව - ඇමැතිතුමා පමණි. දින 03 යි. පසු විපරම් වාර්තාවක් ලබා දී නැත.
- මෙක්සිකෝව කැන්කුන් නගරය - එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්සාය සමුළුව.
- නෙදර්ලන්තය - නාගරික කෘෂිකර්මය හා ආහාර සුරක්ෂිතතාවය සඳහා සම්පත් මධ්‍යස්ථානය (RUAF) විසින් සංවිධානය කරනු ලැබූ ජාත්‍යන්තර සමුළුව ඇමතීම සඳහා කරන ලද ආරාධනය.
- චීනය - ගරු බස්නාහිර පළාත් සභා මන්ත්‍රීතුමන්ලා සඳහා වූ විදේශ පුහුණු වැඩ මුළුව - සභා ලේකම් කාර්යාලය මගින් ප්‍රතිපාදන දී ඇත.
- මියන්මාරය - පොලිතීන් භාවිතය සාර්ථක ලෙස පාලනය කර ඇති කලාපීය රාජ්‍යයක් වන මියන්මාරයේ ඒ සඳහා භාවිතා කර ඇති ක්‍රමවේදයන් පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනය.
- චීනයේ ෂැංහයි - බස්නාහිර පළාත් සභාව අතර අවබෝධතා ගිවිසුම ප්‍රකාර නිල සංචාරය.
- වියට්නාමය - බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා මන්ත්‍රීතුමන්ලන්ගේ හා නිලධාරීන්ගේ වියට්නාම සංචාරය.
- බ්‍රසීලයේ රියෝද ජනයිරෝ නුවර - තිරසාර සංවර්ධනය උදෙසා වන ප්‍රාන්ත රාජ්‍යයන්ගෙන් එකමුතුව (nrg4sd) සාමාජික රටවල් සඳහා වන සමුළුව.
- ඇමෙරිකා එක්සත් ජනපදය නිව්යෝක් නුවර - එක්සත් ජාතීන්ගේ 67 වන සමුළුවේදී සම සභාපති ලෙස තිරසාර සංවර්ධනය උදෙසා වන ප්‍රාන්ත රාජ්‍යයන්ගේ එකමුතුව නියෝජනය කිරීම - හිටපු ජනාධිපතිතුමා සමග ඇමැතිතුමා සහභාගී වී ඇත.

- ඊජිප්තුව - බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සාමාජික මන්ත්‍රීතුමන්ලාගේ අධ්‍යයන වැඩ සටහන.
- සිංගප්පූරුව - බුදු දහම හා පරිසරය පිළිබඳ සම්මන්ත්‍රණයකට සහභාගීවීම හා දේශණයක් පැවැත්වීම - ඇමැතිතුමා පමණි.
- පෝලන්තය වෝර්සෝ නුවර - එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ 19 වන පාර්ශවකරුවන්ගේ සමුළුව.

ඈ.

- ගරු බස්නාහිර පළාත් සභා මන්ත්‍රීතුමන්ලා
- කෘෂිකර්ම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කමිටු සාමාජික ගරු මන්ත්‍රීතුමන්ලා
- අමාත්‍යාංශ ලේකම්තුමා
- පළාත් සභාවේ නිලධාරීන්
- අමාත්‍යාංශ සහකාර ලේකම් (පාලන)
- අමාත්‍යාංශ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
- පරිසර නිලධාරී
- ව්‍යාපෘති නිලධාරී

ඉ.

- ඕස්ට්‍රේලියාව - රු. 376,607.92
- මෙක්සිකෝව (කැන්කුන් නගරය) - රු. 619,962.22
- නෙදර්ලන්තය - රු. 586,571.51
- චීනය - රු. 79,000.00 (ගුවන් ටිකට්පත සඳහා පමණක් මෙම අමාත්‍යාංශය මගින් වියදම් දරා ඇත.)
- මියන්මාරය - රු. 421,139.85
- චීනයේ ෂැංහයි - මෙම අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන ලබා දී නොමැත.
- වියට්නාමය - රු. 485,255.29
- බ්‍රසීලයේ රියෝද ජනයිරෝ නුවර - රු. 1,947,107.20
- ඇමෙරිකා එක්සත් ජනපදය නිව්යෝක් නුවර - මෙම අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන ලබා දී නොමැත.
- ඊජිප්තුව - රු. 318,559.92
- සිංගප්පූරුව - රු. 91,800.00
- පෝලන්තය වෝර්සෝ නුවර - රු. 430,400.00

ඊ. රු. 5,539,329.70

උ.

- **2010.12.05 – 2010.12.12 මෙක්සිකෝව කැන්කුන් නගරය, එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාසය සමුළුව**

  බරාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර පරිසර සංවිධාන, ආයතන හා රාජ්‍යයන් දැනුවත් කිරීමටත්, ඔවුන්ගේ අවධානය යොමු කරවා ගැනීමටත් 2010 නොවැම්බර් 29 දින සිට දෙසැම්බර් 10 දින දක්වා මෙක්සිකෝවේ, කැන්කුන් නගරයේ පැවැත්වනු ලැබූ කාලගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවෙහි ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. එම ප්‍රදර්ශන කුටි ගාස්තු අය කිරීමකින් තොරව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙම අමාත්‍යාංශයට ලබාදුන් අතර, ඒ සඳහා රජයේ පරිසර අමාත්‍යාංශයේ විශේෂ අනුමැතිය හා සහායද ලැබුණි. එමගින් බරාව ජෛව විවිධත්ව උද්‍යාන ව්‍යාපෘතිය පිළිබඳව අන්තර්ජාතික ප්‍රජාව දැනුවත් කිරීමටද හැකියාව ලැබුණි.

- **2011.05.18 – 2011.05.23 නෙදර්ලන්ත චාරිකාව**

  නාගරික කෘෂිකර්ම හා ආහාර සුරක්ෂිතතාවය සඳහා සම්පත් මධ්‍යස්ථානය (RUAF) විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සමුළුවක් වන “Urban agriculture for resilient cities; Lessons Learnt in Policy Research and Practice” සමුළුව ඇමැතීම සඳහා කරන ලද ආරාධනයට අනුව එයට සහභාගී වීම සඳහා උක්ත චාරිකාවට සහභාගී විය. දැනටමත් බස්නාහිර පළාතේ ක්‍රියාත්මක වන නාගරික කෘෂිකර්මය පිළිබඳ ව්‍යාපෘතිය වඩාත් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ජාත්‍යන්තර දැනුම හුවමාරු කර ගැනීමට මෙම විදේශ සංචාරය ඉවහල් විය. යුරෝපයේ සහ සංවර්ධනය වෙමින් පවතින රටවල

අන්තර්ජාතික ප්‍රජාව, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානයන්හි නියෝජිත ප්‍රජාව සමග අත්දැකීම් හා දැනුම හුවමාරු කර ගැනීමට උක්ත චාරිකාව විශේෂයෙන් උපකාර වන ලදී.

හරිත නගර සැලසුම්කරණය, උද්‍යාන විද්‍යාව ආශ්‍රිත කෘෂිකර්මය, නගරයන්හි අපද්‍රව්‍ය බැහැර කිරීම යන තේමාවන් ඔස්සේ අත්දැකීම් හා දැනුම ලබා ගැනීමට මෙම නෙදර්ලන්ත චාරිකාව තුළින් හැකියාව ලැබුණි.

- **2011.10.10 – 2011.10.17 මියන්මාර් චාරිකාව**

මියන්මාරයේ මන්ඩලේ (Mandaly) ප්‍රාන්තයේ පොලිතීන් භාවිතය පාලනය කිරීමේ තීරණය ක්‍රියාත්මක කර ඇත. එය ක්‍රියාත්මක කර ඇත්තේ 2011 වර්ෂයේදීය. මියන්මාරයේ යැන්ගොන් ප්‍රාන්තය හෙවත් වාණිජ අගනගරය 2004 වර්ෂයේදී පොලිතීන් භාවිතය පාලනය කිරීමේ විශිෂ්ට ප්‍රතිඵල ළඟා කර ගෙන ඇති බව තහවුරු වූ අතර, කලාපීය රාජ්‍යයක් වන මියන්මාරයේ ඒ සඳහා භාවිතා කර ඇති ක්‍රමවේදයන් පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනය සඳහා මෙම චාරිකාව යොදා ගන්නා ලදී. උක්ත කරුණට අදාළව ක්ෂේත්‍ර නිරීක්ෂණයන් හා අදාළ රාජ්‍ය හා පෞද්ගලික ආයතන ප්‍රධානීන් සමග සාකච්ඡා කිරීම, දේශපාලන නායකත්වය සමග අදහස් හුවමාරු කර ගැනීමට අදාළ වැඩ සටහනකට සහභාගී වීම මෙම චාරිකාවේ මූලික අරමුණ විය. ඒ අනුව බස්නාහිර පළාත තුළ පොලිතීන් භාවිතය පාලනය කිරීම ක්‍රියාත්මක කිරීමේදී සමාජයේ විවිධ ස්ථරයන් දැනුවත් කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වූ අතර, ඒ සඳහා වසර 02 ක් පමණ ගත කිරීමට සිදු විය. එසේම පොලිතීන් නිෂ්පාදකයන්, පොලිතීන්වලින් නිෂ්පාදිත ද්‍රව්‍ය පරිහරණය කරනු ලබන සුපිරි වෙළඳසල් හිමියන් සහ ඒ හා සමාන වැදගත්කමක් පවතින ආයතන හිමිකරුවන්/පාලකයන්ද, දැනුවත් කිරීම් කළ අතර, පළාතේ පොලිතීන් භාවිතය පාලනය කිරීම සඳහා ඉදිරිපත් කළ පොලිතීන් භාවිතය පාලනය කිරීමේ ප්‍රඥප්තිය බස්නාහිර පළාත් සභාවේ ඒකඟතාවය මත පාර්ලිමේන්තුවට 2011.09.09 දින ඉදිරිපත් කළ අතර, ඒ අනුව එය ක්‍රියාත්මක කිරීමට 2011 වර්ෂයේදී සිදු වීම හා එහි වගකීම මෙම අමාත්‍යාංශයට පැවරී තිබීම හේතුවෙන් සහ ඍජුවම අදාළ පළපුරුද්ද මෙම අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සම්පාදනයට ඉවහල් විය. (පසු විපරම් වාර්තාව ඇමුණුම 01)[1]

- **චීන මහජන දේශපාලන උපදේශක සම්මේලනය ෂැංහයි කමිටුව සහ ශ්‍රී ලංකා බස්නාහිර පළාත් සභාව අතර, ද්විපාර්ශවීය සහයෝගීතාව සහ මිත්‍රත්ව හුවමාරුව පිළිබඳ අවබෝධතා ගිවිසුම - 2011.11.14 සිට 19 දක්වා**

නවීන තාක්ෂණය භාවිතා කර කෘෂිකර්ම ගොවිපලක් සකසන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම (මෙහිදී පළතුරු, වී, එළවළුවල අස්වැන්න වැඩිකර ගැනීමේ නවීන තාක්ෂණික ක්‍රම පිළිබඳ අධ්‍යයනය කෙරුණි)

පෙහෙකම් කර්මාන්ත සඳහා චීනයෙන් නූල් ආනයනය කිරීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය.

කුඩා හා මධ්‍යම පරිමාණයේ පෙහෙකම් කර්මාන්ත, අත්කම් නිෂ්පාදන, කෘෂිකර්මාන්තය, පරිගණක මෘදුකාංග හා දෘඩාංග ක්ෂේත්‍ර සඳහා භාවිතා කළ හැකි චීන තාක්ෂණික උපකරණ පිළිබඳ දැනුවත් කිරීම සඳහා කොළඹ නගරයේදී ප්‍රදර්ශනයක් පැවැත්වීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම.

පෙහෙකම් කර්මාන්ත, අත්කම් නිෂ්පාදන සඳහා චීනයේ ප්‍රදර්ශන කුටි පැවැත්වීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම.

චීනයෙන් පරිගණක උපාංග ආනයනය කිරීමේ අවස්ථා පිළිබඳ අධ්‍යයනය කිරීම.

දේශීය කර්මාන්තකරුවන් සඳහා සුළු හා මධ්‍යම පරිමාණයේ ආයෝජකයින් හඳුන්වාදීමට පියවර ගැනීම.

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

- **මෙම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා ගරු මන්ත්‍රීතුමන්ගේ හා නිලධාරීන්ගේ වියට්නාමය සංචාරය - 2012.02.21 සිට 2013.03.01 දක්වා**

 වියට්නාමයේ හැලොන් බේ නගරය හි ඒ ආශ්‍රිතව සිදු වන වැදගත්ම කාර්මාන්තය මුතු කර්මාන්තය හා ධීවර කර්මාන්තය වන අතර, එය හැලොන් බේ ගංගාව ආශ්‍රිතව සාර්ථකව සිදු කරනු ලබන අතර, මෙම ගමනේදී නිරීක්ෂණය වූ වැදගත් කරුණ වූයේ, සංචාරකයන් ගෙන්නා ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළයි. එමෙන්ම එම ප්‍රදේශය ආශ්‍රිතව හස්ත කර්මාන්තය ආකර්ෂණීය ලෙස ක්‍රියාත්මක වන අතර, බොහෝ සංචාරකයින් එම භාණ්ඩ මිලදී ගන්නා බව නිරීක්ෂණය විය. හැනෝයි සිට හැලොන් බේ නගරයට යන අතරමඟ පිහිටා ඇති නිෂ්පාදන හා ප්‍රදර්ශනාගාර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අත්දැකීම් ලබා ගන්නා ලදී.

 මත්ස්‍ය ආහාර, කල් පවතින බෝතල් කළ එළවළු හා පළතුරු ආහාරද නිපදවන අතර, එමෙන්ම හස්ත කර්මාන්ත ගම්මාන පවත්වා ගෙන යාම, ගුවන් සේවා ලබා දීම, හෝටල් සේවා ලබා දීම යනාදී වශයෙන් සංවිධානගත වූ දැවැන්ත රාජ්‍ය ආයතනයක ව්‍යුහය පිළිබඳ හා එහි අත්දැකීම් ලබා ගැනීමට හැකිවිය.

 තවද, මෙම ආයතනයේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය සමග දීර්ඝ සාකච්ඡාවක් සිදු කළ අතර, එහිදී දෙරටේ කෘෂිකර්මාන්තය, හස්ත කර්මාන්තය පිළිබඳ අදහස් හා අත්දැකීම් හුවමාරු කරගන්නා ලද අතර, ඉදිරියේදී වෙළඳ ගණුදෙනු සිදු කිරීම වෙනුවෙන් අවශ්‍ය පසුබිම සකස් කර ගන්නා ලදී.

- **තිරසාර සංවර්ධනය උදෙසා වන ප්‍රාන්ත රාජ්‍යයන්ගේ එකමුතුව (nrg4SD) සාමාජික රටවල් සඳහා වන බ්‍රසීලයේ රියෝද් ජනයිරෝහි පැවැත්වූ වාර්ෂික මහා සමුළුව - දිනය - 2012.06.14 සිට 2012.06.27 දක්වා**

 උක්ත සඳහන් වාර්ෂික මහා සමුළුවේදී, ප්‍රධානවම තිරසාර සංවර්ධනය, ජෛව විවිධත්වය, ජල සම්පත් කළමනාකරණය හා සනීපාරක්ෂක ක්‍රමවේද පිළිබඳ දැනුම සහ අත්දැකීම් පිළිබඳ සාකච්ඡා විය. මෙහිදී පැවැති සමුළුවේදී බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සහ වැඩ පිළිවෙළ පිළිබඳ අදහස් ජාත්‍යන්තර සංවිධාන ඉදිරියේ කියා පෑම, තිරසාර සංවර්ධනය පිළිබඳ නව ප්‍රවණතා පිළිබඳ සාමාජිකයින් දැනුම්වත් කිරීම ප්‍රධානවම සිදු විය.

 ශ්‍රී ලංකාවද ජෛව විවිධත්වයෙන් හා ඒකදේශික ජීවීන්ගෙන් බහුල කුඩා දිවයිනක් වන අතර ශ්‍රී ලංකාව තුළ පවතින මෙම අධික ජෛව විවිධත්වය හා ඊට බලපා ඇති දැඩි අවදානම හේතුවෙන් ශ්‍රී ලංකාව ජෛව විවිධත්වය සම්බන්ධයෙන් සුවිශේෂ ස්ථාන (Biodiversity Hotspot) අතුරින් එකක් ලෙස නම් කර ඇත. එබැවින් උක්ත සමුළුවේදී ලබා ගත් නව දැනුම හා තාක්ෂණය ශ්‍රී ලංකීය ප්‍රජාව වෙත ලබා දීමටත් ඊට අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමටත් කුටුම්භ මට්ටමේ සිට ප්‍රජාව ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා යොමු කිරවීමටත් මෙහිදී ලද අත්දැකීම් හා දැනුම බෙහෙවින් ඉවහල් විය.

 එමෙන්ම විවිධ රටවල සිදු කරන ලද විවිධ සංවර්ධන වැඩ සටහන්, එම සංවර්ධන වැඩ සටහන් තුළින් තිරසාර සංවර්ධන අරමුණු කරා ළඟා වන්නේ කෙසේද, තිරසාර සංවර්ධනය පිළිබඳ නව ප්‍රවණතා කවරේද යන්න පිළිබඳව මනා අවබෝධයක් ද ලබා ගැනීමටද හැකි විය. තවද සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන කටයුතු ඉතා සාර්ථක ලෙස සිදු කිරීමට අවශ්‍ය දැනුම සහ සහාය ලැබීමද උක්ත සමුළුවට සහභාගී වීමෙන් ලද ප්‍රතිලාභ අතුරින් එකකි.

- **චාරිකාව - අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සාමාජිකයන් සඳහා සංවිධානය කළ ඊජිප්තුවේ කයිරෝ සංචාරය - දිනය - 2013 පෙබරවාරි 28 සිට මාර්තු 05 දක්වා**

 විශේෂයෙන්ම උක්ත අධ්‍යයන සංචාරය සඳහා සහභාගී වූ සැමගේ විශේෂ අවධානය, කරදිය

නිසා බස්නාහිර පළාතේ වගා කළ නොහැකිව වාර්ෂිකව පුරන් වන 15% ක් වන කුඹුරු බිම් ප්‍රමාණය නැවත වගා කිරීමට ඊජිප්තුවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහායද, ඒ සඳහා පූර්ණ සහාය ලබා දීමට ශ්‍රී ලංකා තානාපතිතුමාගේ කැමැත්ත හා එකඟතාවයද ලැබීම.

සුළු පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා ගැනීමටත්, ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමටත්, හස්ත කර්මාන්ත හා පේෂ කර්මාන්ත නිෂ්පාදනයන් සඳහා ආකර්ෂණීය ඇසුරුම් ක්‍රම හඳුන්වා දීමට හා ප්‍රචාරණ ක්‍රමවේදයන් දියත් කිරීමටත් යෝග්‍ය බව තීරණය කිරීම.

පළාතේ කුඹුරුවල වී අස්වැන්න වියළි කලාපයට සාපේක්ෂව අවම මට්ටමක පැවතීම නිසා බොහෝ කුඹුරු පුරන් වීම සිදුවේ. එබැවින් එකී ඉඩම්වලින් උපරිම උපයෝජනයක් තහවුරු කර ගැනීම සඳහා ගැළපෙන පළතුරු නිෂ්පාදනය සඳහාද ගොවීන් යොමු කිරීමටත් තීරණය විය. (අධ්‍යයන චාරිකාවේ පසු විපරම් වාර්තාව ඇමුණුම 02)[2]

- **විදේශ චාරිකාව - 2013 නොවැම්බර් මස 18 දින සිට 23 දක්වා පෝලන්තයේ වෝර්සෝ නුවර පැවැත්වූ එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මේලනයේ 19 වන වාර්ෂික සමුළුව**

  2013 නොවැම්බර් මස 18 දින සිට 23 දක්වා පෝලන්තයේ වෝර්සෝ නුවර පැවැත්වූ එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මේලනයේ 19 වන වාර්ෂික සමුළුව සඳහා සහභාගී වීමේ ප්‍රධාන අරමුණ වූයේ, ශ්‍රී ලංකාවද දේශගුණ විපර්යාසයන්හි අහිතකර ප්‍රතිඵලවලට වේගයෙන් ගොදුරු වෙමින් පවතින බැවින් එම ක්ෂේත්‍ර යේ නව ප්‍රවණතා හඳුනා ගැනීමටත් උක්ත වාර්ෂික මහා සමුළුව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඒ පිළිබඳ අදහස් හා යෝජනා ප්‍රකාශ කිරීමත්ය.

  ඒ අනුව උක්ත සමුළුව සඳහා බස්නාහිර පළාතේ නියෝජනය සහ සහභාගී වීම ඉතා වැදගත් වූ අතර එහිදී අප පළාත තුළ මේ වන විටත් සිදු කෙරෙන දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රමෝපායන් හා වැඩ පිළිවෙළ පිළිබඳ අදහස් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙහිදී පැවැති සමුළුවේදී දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රමෝපායන් ජාත්‍යන්තර සංවිධාන ඉදිරියේ කියා පෑම, දේශගුණ විපර්යාස අවම කිරීම පිළිබඳ නව ප්‍රවණතා පිළිබඳ සාමාජිකයින් දැනුම්වත් කිරීම සහ සාමාජිකයින් අතර අත්දැකීම් හුවමාරු කර ගැනීම ප්‍රධාන අරමුණ විය.

  එහිදී ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම සහ එහි අනිටු ප්‍රතිවිපාක ප්‍රධානවම සාකච්ඡා විය. එමෙන්ම මෑතකදී විවිධ රටවල සිදු වූ ස්වභාවික විපත්, ගංවතුර තර්ජන හා මුහුදු මට්ටම ඉහළ යාමද එමගින් ප්‍රජාවට අත්විඳීමට සිදු වූ විවිධ දුෂ්කරතා හා ඒවා මැඩ පැවැත්වීමට ගත හැකි ක්‍රියාමාර්ගයන් කවරේද යන්න වැඩිදුරටත් සාකච්ඡා විය.

  ඒ අනුව උක්ත සමුළුව සඳහා සහභාගී වීමෙන්, ප්‍රධානවම විවිධ රටවල සිදු කරන ලද දේශගුණ විපර්යාස අවම කිරීම පිළිබඳ විවිධ වැඩ සටහන් කවරේද, එම වැඩ සටහන් තුළින් දේශගුණ විපර්යාස අවම වන්නේ කෙසේද යන්න හා ඊට අනුගත වන්නේ කෙසේද යන්න පිළිබඳ මනා අවබෝධයක් මෙන්ම ඇත්දැකීම්ද ලබා ගැනීමට හැකි විය.

  එබැවින් උක්ත සමුළුව සඳහා සහභාගී වීමෙන් අනතුරුව බස්නාහිර පළාතෙහිද තව තවත් දේශගුණ විපර්යාස අවම කිරීම පිළිබඳ විවිධ වැඩසටහන් පැවැත්වීමත් ඊට අනුගත වීම සඳහා ප්‍රජාව දැනුවත් කර ඉදිරි සංවර්ධන කටයුතු ඉතා සාර්ථක ලෙස සිදු කිරීමත් ප්‍රධාන අරමුණ වේ.

ඌ. එක්සත් ජාතීන්ගේ 67 වන සමුළුවේදී සම සභාපති ලෙස තිරසාර සංවර්ධනය උදෙසා වන ප්‍රාන්ත රාජ්‍යයන්ගේ එකමුතුව නියෝජනය කිරීම හේතුවෙන්, ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන ලබා දී නොමැත.

[2] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මට අතුරු ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ගරු ඇමැතිතුමා ඕක ඇතුලේ තිබෙනවාද කුඹුරු එපා වැව් හදමු. ඒ සංකල්පයට කොහෙන් හරි විදේශ සංචාර හරහා උදව්වක් වෙලා තිබෙනවාද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

නැහැ. නැහැ. කුඹුරු එපා. වැව් හදමු. එහෙම එකක් නම් මම කියවද්දී හම්බ වුණේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම වෙලා තිබෙනවා. ඒකයි.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services, Trade Affairs and Information)

ගරු මන්ත්‍රීතුමා කියන්න හදන්නේ අර -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එතුමා කෘෂිකර්ම ඇමැති වුණු ගමන් අර කටුබැද්ද වෙල් යායේ පුරන් කුඹුරු අස්වද්දමු කියලා පටන් ගත්තා. ඒකට මමත් සහභාගි වුණා. දැන් ඒක පැත්තකට දාලා වැවක් හදලා තිබෙනවා. කෘෂිකර්මයයි, ඒකයි අතර සම්බන්ධය මොකක්ද? කියලා. ඒ පැත්තේ කෘෂි කර්මාන්තයට වැව කිසි සම්බන්ධයක් නැහැ.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

වැව් දහ දාහක් හදපු එක.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක පාර්ලිමේන්තුවේදී අහන්න කෝ. ඔබතුමන්ලාගේ කට්ටිය ඉන්නවා නේ? ඒවා වෙනම අහන්න. මම අහන්නේ මේ පළාත් සභාවේ කෘෂිකර්ම ඇමැතිතුමාගෙන්. විෂයය ගැන දන්නේ නැද්ද? මම මේ පළාත් සභාවට අයිති විෂයය ගැන කථා කරන්නේ. අරක පාර්ලිමේන්තුවේ අහන්න ඕනෑ. මෙතැන අහන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අහන වේලාවේ අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ. ගරු ඇමැතිතුමා, ඔබතුමා පිළිතුරු සභාගත කරන්න. පස්සේ ඔබතුමා -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මම සභාගත කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

විදේශ සංචාරයකින් මුදල් ආපු එකක් ගැනද අහන්නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. නැහැ. මම අහන්නේ අර වැව් වැඩෙයි මේකයි අතරේ සම්බන්ධය මොකක්ද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා ඒ ගැන - ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ප්‍රශ්නය තිබෙන්නේ -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම අහන්නේ, දැන් එතුමා කෘෂිකර්ම විෂයය නේ භාරව සිටියේ. නමුත් එතුමා කරලා තිබෙන්නේ වැව් හදන කටයුත්ත. ඒක එහෙම වුණේ කොහොමද කියලා අලුත් ඇමතිතුමාගෙන් අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට පුළුවන්ද ඒ සම්බන්ධයෙන් -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒ පිළිබඳව පිළිතුරු දීම ඊළඟ සභාවේදී ඉදිරිපත් කරන්නම්.

## මීගමුව අධ්‍යාපන කලාපය : 2009 වසරේ වසා දමපු පාසල්
NEGAMBO EDUCATION ZONE : CLOSED SCHOOLS in 2009

**04.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමාගෙන් ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/15/04)**

අ. මීගමුව අධ්‍යාපන කලාපය තුළ වර්ෂ 2009 න් පසු වසා දමා ඇති පාසල් ගණන කවරේද?

ආ. එසේ වසා දමන ලද පාසල්වල නම් සහ වසා දමන අවස්ථාවේ එකී පාසල්වල සිටි සිසුන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද?

ඇ. 2015 වසරේදී වැසීමට නියත වෙනත් පාසල් මීගමුව අධ්‍යාපන කලාපය තුළ පවතීද?

ඈ. එසේ වැසීමට නියමිත පාසල් මීගමුව අධ්‍යාපන කලාපය තුළ පවතී නම් එකී පාසල්වල නම් මොනවාද?

ඉ. එසේ වැසීමට නියමිත පාසල් පවතී නම් එකී පාසල්වල නම් සහ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

ඊ. ඉහත කී ලෙස පාසල් වසා දැමීමට හේතුව කුමක්ද?

උ. ඉහත කී ලෙස දැනට වසා දමා ඇති පාසල්වල සිසුන් වෙනත් පාසල් වලට ඇතුළත් කළේ නම් එසේ සිසුන් ඇතුළත් කළ නව පාසල්වල නම් සහ ඇතුළත් කළ සිසුන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. එක් පාසලකි. (වසා දමන ලද වර්ෂය - 2011)

ආ. බප/මීග/ මහුල් පොකුණ නිමල මරියා බාලිකා ප්‍රාථමික විද්‍යාලය.
සිසුන් ගණන - 08

ඇ. නැත.

ඈ. අදාළ නොවේ.

ඉ. අදාළ නොවේ.

ඊ. පාසල පත්වාගෙන යාමට සිසුන් ප්‍රමාණවත්ව නොසිටීම.

උ. සිසුන්ගේ පදිංචිය සලකා බලා පහත සඳහන් පරිදි සිසුන් පාසල්වලට යොමු කරන ලදී.
සිසුන් 02 - උසාවි නියෝගයක් මත කන්‍යාරාමයට යොමු කරන ලදී.
සිසුන් 02 - බප/මීග/ පේරලන්ද සා. ජෝෂප් ක.ද්වි. විද්‍යාලයට යොමු කරන ලදී.
සිසුන් 02 - බප/මීග/නාගොඩ ජෝන්ද බැප්ටිස්ට් ක.ද්වි. විද්‍යාලයට යොමු කරන ලදී.
සිසුන් 02 - බප/කැල/ ඇලපිටිවල චන්ද්‍රවංශ විද්‍යාලයට යොමු කරන ලදි.

## මීගමුව ආඬිඅම්බලම මහ විද්‍යාලය : ගොඩනැගිලි කඩා ඉවත් කිරීම
NEGAMBO ADIAMBALAMA MAHA VIDYALAYA : DEMOLISHED AND REMOVED BUILDINGS

**05.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමාගෙන් ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/15/05)**

අ. මීගමුව අධ්‍යාපන කලාපය තුළ බප/මීග/ආඬිඅම්බලම මහා විද්‍යාලයේ ඉදි කළ මහින්දෝදය විද්‍යාගාරය පාරට පෙනෙන ආකාරයට ඉදි කිරීම සඳහා පාසලේ පැවැති ගොඩනැගිල්ලක් කඩා ඉවත් කළ බව ඔබතුමා දන්නේද?

ආ. මීග/ආඬිඅම්බලම මහා විද්‍යාලයේ කඩා දමන ලද ගොඩනැගිල්ලේ පවත්වා ගෙන ආ පංති කාමර

මේ වන විට පවත්වා ගෙන යාමට නිසි ස්ථානයක් නොමැතිව, සිසුන් අසරණ තත්ත්වයට පත්ව ඇති බව ඔබතුමා දන්නේද?

ඈ. එකී විද්‍යාලයේ කඩා දමන ලද ගොඩනැගිල්ලෙහි පවත්වා ගෙන ආ පංති පැවැත්වීම සඳහා ඔබතුමා විසින් මේ වන විට වෙනත් ගොඩනැගිල්ලක් එම පාසලට ලබා දීමට පියවර ගෙන තිබේද?

ඈ. එකී මීග/ආඩිඅම්බලම විද්‍යාලයට කතෝලික ආගම උගන්වන ගුරුවරයෙක් පත් කරන්නේ කවදාද?

ඉ. ඉහත ගැටලු කුමන කාල පරිච්ඡේදයක් තුළ විසඳා අවසන් කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ඉතා පැරණි අබලන් තත්ත්වයේ තිබූ ගොඩනැගිල්ල ප්‍රදේශීය ඉංජිනේරුගේ නිර්දේශය මත ගොඩනැගිලි අධ්‍යක්ෂකගේ අනුමැතිය යටතේ කඩා ඉවත් කිරීම සිදු කර ඇත.

ආ. ඉතා පැරණි අබලන් තත්ත්වයේ තිබූ ගොඩනැගිල්ල අවධානම් සහිත තත්ත්වයක පැවතුණු නිසා එම ගොඩනැගිල්ලේ තිබුණු පන්ති කාමර දෙක විදුහලේ වෙනත් ස්ථාන දෙකක ස්ථාපිත කර බාධාවකින් තොරව දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සිදු කරනු ලබයි.

ඇ. 2016 වර්ෂයේදී නව ගොඩනැගිලි සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට යෝජනා ඉදිරිපත් කර ඇත.

ඈ. වෙනත් විෂයයන් උගන්වන රෝමානු කතෝලික ගුරු භවතුන් දෙදෙනෙකු මගින් දැනට විෂයය ආවරණය කරන අතර අන්තර් පළාත් ස්ථාන මාරු යටතේ බස්නාහිර පළාතට නිදහස් වී පැමිණෙන ගුරු භවතෙකු හෝ 2014 වර්ෂයේ පවත්වන ලද උපාධිධාරී ගුරු විභාගයේ ප්‍රතිඵල විභාග දෙපාර්තමේන්තුවෙන් ලද විගස ඒ යටතේ බඳවා ගන්නා නව ගුරු භවතෙකු නොපමාව ලබා දීමට කටයුතු කෙරේ.

ඉ. අන්තර් පළාත් ස්ථාන මාරු යටතේ සුදුසු ගුරු භවතෙකු ලද විගස හෝ 2014 වර්ෂයේ පවත්වන ලද උපාධිධාරී ගුරු විභාගයේ ප්‍රතිඵල විභාග දෙපාර්තමේන්තුවෙන් ලද විගස.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සුදුසු ස්ථාන දෙකක පන්ති කාමර දෙකක් තිබෙනවා කියලා ඔබතුමා උත්තර දුන්නේවිදුහල්පතිතුමා සිසුන්ට දන්වලා තිබෙනවා පන්ති කාමරයක් සඳහා තාවකාලිකව මඩුවක් වාගේ දෙයක් හදා ගන්න රුපියල් 300/- ගණනේ එකතු කරන්න කියලා. ඒ ගැන ඔබතුමා දන්නවාද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන් කරන්න කටයුතු කර තිබුණත්, වර්තමානයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන ක්‍රියාත්මක නොවන නිසා ඒ සඳහා විකල්ප වැඩ පිළිවෙළක් යෝජනා කරන්න උවමනාව වෙන්න ඇති. මුදල් එකතු කිරීම විධිමත් අනුමැතියක් ලබා ගෙන සිදු කරනවාද කියන තොරතුර නැහැ. ඊළඟ සභා වාරයේදී ඊට අදාළ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න පුළුවන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සුදුසු ස්ථානයක් ගන්න -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සුදුසු ස්ථානයක් ගන්න නොවෙයි මම හිතන්නේ සල්ලි එකතු කරන්නේ. තාවකාලික එකක් හදන්න කියලා ප්‍රශ්නයේ පිළිතුරට තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ලබන සභා වාරයට උත්තර දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

හොඳයි.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, මේ රටේ සමුපකාර ව්‍යාපාරය අවුරුදු 100 කට වඩා පැරණි, ඉතාම හොඳ මහජන ව්‍යාපාරයක් හැටියට නම් දරා සිටින ව්‍යාපාරයක් බව. මේ සමුපකාර ව්‍යාපාරය තුළ යහපත්ව, ඉතාම හොඳින් වැඩ කළොත් මිනිස්සු කීර්තිමත් පුද්ගලයන් බවට පත් වෙනවා. ඒ වාගේම සමුපකාර ව්‍යාපාරය තුළ අවිධිමත් ආකාරයට හොරකමට ගිජු වෙමින් තනතුරු හෙබ වූවොත් ඔහු අපකීර්තිමත් පුද්ගලයෙක් බවට පත් වෙනවා. ඒක නවත්වන්න පුළුවන්කමකුත් නැහැ. අපේ සාමාන්‍ය දැනීමේ හැටියට කියන්න තිබෙන එකම වචනය තමයි සමුපකාරය කාපු එකා අපාගත වෙනවා කියන එක.

හෝමාගම විවිධ සේවා සමුපකාර සමිතිය අද විශාල ප්‍රශ්න ගණනාවකට විතරක් නොවෙයි, මූල්‍ය වංචා ගණනාවකටම සම්බන්ධ වෙමින් පරීක්ෂණ පවත්වාගෙන යනවා. එයින් එකක් තමයි, ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා රත්‍රං බඩු වෙන්දේසියක් පිළිබඳව පසුගිය කාලයේ මේ සභාවට හෙළිදරව්වක් කළා. රත්‍රං කිලෝ 35 ක්. මේකේ පරීක්ෂණය කර ගෙන යන කොට, ඒ පරීක්ෂණය පිළිබඳව අදාළ නිවැරදි තොරතුරු දීපු සේවකයන් පස් දෙනෙක් මේ වන කොට සී සී කඩ මාරු කරලා තිබෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ මේ සමුපකාර සමිතියේ වැරදි අනන්ත අප්‍රමාණ වුණා. මහ සභාව පවත්වන්න සූදානම් වුණේ බදුල්ලේ. මේ හෝමාගම සමුපකාර සමිතියේ මහ සභාව පවත්වන්න සූදානම් කළේ බදුල්ලේ. මේක සමුපකාර කොමසාරිස්වරයා මැදිහත් වෙලා නැවැත්තුවා. හැබැයි, අනික් පැත්තෙන් ඒකම, මහ සභා නියෝජිතයන් එක්කම අපි යනවා පුහුණු වැඩ සටහනකට කියලා, බදුල්ලේ ගිහිල්ලා තිබෙනවා. දැන් මේ වන කොට සමුපකාරයේ සභාපතිතුමා, සමුපකාරයේ සමාන්‍යාධිකාරීතුමියත් ඊයේ පෙරෙයිදා ඩුබායි යන්න මුදල් සූදානම් කර ගෙන තිබුණා. (බාධා කිරීම්) මේවා ඒ අයගේ සල්ලි නොවෙයි. අපේ මහජන සල්ලි. ඒ නිසා මේක සමුපකාර කොමසාරිස්වරයා නැවැත්තුවා. නැවැත්තුවාම, අද සමුපකාර කොමසාරිස්වරයාට විරුද්ධව නඩු යනවා කියලා තිබෙනවා. මේක නැවැත්වීම පිළිබඳවම සමුපකාර අධ්‍යක්ෂ මණ්ඩලයේ තීන්දුවක් අරගෙන මුදල් වෙන් කර ගෙන තියෙනවා. සමුපකාර කොමසාරිස්වරයාට විරුද්ධව නඩු යන්න. අනික් පැත්තෙන් සමුපකාරයේ ලේකම් තනතුර, මූල්‍ය කළමනාකාරී තනතුර, බැංකු සේවා කළමනාකාරී තනතුර, මානව සම්පත් තනතුර මේ සියල්ලම හිස්. සමුපකාර ලිපිකරුවන් විධියට ඉන්න අයට වැඩ බැලීමේ පදනම මත මේ තනතුරු දීලා අවශ්‍ය විධියට පවත්වාගෙන යනවා. ඒ වාගේම අපි මතක් කරන්නට ඕනැ. මේ සමුපකාරය තුළ අධ්‍යක්ෂකවරුන්ව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඉවත් කර ගත්තා. ඉවත් කර ගන්න කටයුතු කළා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි මේකට පැහැදිලිව කියන්නේ. මේ සමුපකාර ව්‍යාපාරය විනාශ කරලා බිමටම වට්ටනවා. මේකට දේශපාලන නායකත්වය වගකියන්න ඕනැ. අපි මේ ගැන පළාත් සභාවේ නිමල් ලන්සා ගරු ඇමැතිතුමාත් එක්ක කථා කළා. අපි දන්නවා, ජනාධිපති මන්දිරයෙන් ආපු නියෝගවලට මේ දූෂණ යට වෙමින් යන බව. පළාතේ ඇමැතිවරයාටත් මේකට විරුද්ධව කටයුතු කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ සමුපකාරයේ මේ තරමේ මහජනයාගේ අයිතිවාසිකම් ආරක්ෂා නොකරන තැනකට ගෙනිහිල්ලා තිබෙන්නේ එවකට හිටිය කැබිනට් ඇමැතිවරයෙකුගේ සම්පූර්ණ බලපෑම නිසා කියන එක අපි මතක් කරන්න කැමැතියි. ඒ නිසා අද ඒ කැබිනට් ඇමැතිවරයා නැති වුණොත් අපි මතක් කරන්නේ, මේ පළාත් සභාවට තිබෙන බලය පාවිච්චි කරලා - අපි කියන්නේ, මේ සමුපකාරය භාරව පළාත් සභාවේ ඉන්න ඇමැතිවරයා, මට මේ ඉහළින් නියෝග එනවා කියලා කියන්නේ නැතිව කොන්ද කෙළින් තියාගෙන තීන්දුවක් අරගෙන මේ සමුපකාරය නිවැරදි තැනකට ගන්නය කියන එක තමයි අපි මතක් කරන්නේ.

අද සමුපකාරය භාරව ඇමැතිතුමා මෙතැන නැහැ. නමුත් වැඩ බලන ඇමැතිතුමාට අපි මතක් කරන්න කැමැතියි. රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමාට මතක් කරන්න කැමැතියි. ඔබතුමා වැඩ බලන ඇමැතිවරයා හැටියට, මම හිතන්නේ හෙට වෙනකොට එතුමා දිවයිනට පැමිණෙනවා. මේ තත්ත්වය පැහැදිලි කරලා මේ සමුපකාරය හොරුන්ගෙන් ආරක්ෂා කරගන්න අවශ්‍ය කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, 2014 එකොළොස් වැනි මාසයේ දිනමිණ පුවත්පතේ දැන්වීමක් පළ කරනවා, බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන්. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී තනතුරු පුරප්පාඩු සඳහා රැකියා විරහිත උපාධිධාරීන් අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගැනීම. ගරු සභාපතිතුමනි, මෙම පුවත්පත් දැන්වීම අනුව සුදුසුකම් හැටියට ඉල්ලීමක් කරනවා. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. වරහන් ඇතුළේ තිබෙනවා, උපාධිය වලංගු දිනය 2012.12.31 දිනට පෙර විය යුතුයි කියලා. එතකොට ගරු සභාපතිතුමනි, දැන් මේ සඳහා අයදුම් කරපු අයට මම හිතන්නේ, මේ ඉදිරි කටයුතු සඳහා ලිපි ලැබිලා තිබෙනවා. තොරතුරු දැනගන්න තිබෙන විධියට 2008, 2009, 2010, 2011 වනතුරු, 2011 දෙසැම්බර් 31 විතර වන තුරු මේ උපාධි ලැබූවන් බඳවා ගන්න තීරණයක් අරගෙන තිබෙනවා.

නමුත් ගරු සභාපතිතුමනි, උපාධිධාරීන් පිරිසක් මා හට ලිපියක් යොමු කළා. ඒ නිසා තමයි විශේෂයෙන්ම මම මේ පිළිබඳව අවධානය යොමු කරන්න හිතුවේ. 2012 දෙසැම්බර් 31 වැනිදා වනතුරු උපාධිය ලැබූවන් කිව්වාම 2011 දෙසැම්බර් 31 වැනිදා සිට 2012 දෙසැම්බර් 31 වනතුරු උපාධිධාරීන් පිරිසක් ඉන්නවා. ගරු සභාපතිතුමනි, ඒ ගොල්ලෝ කියන්නේ නැහැ, ඒ ගොල්ලන්ට හදිසියේ රැකියාව දෙන්නය කියලා. සාධාරණ ඉල්ලීමක් තිබෙනවා. ඒ ගොල්ලෝ කියන්නේ මේ අවුරුද්ද ඇතුළත ඉන්න උපාධිධාරීන් ටිකත් සම්මුඛ පරීක්ෂණවලට කැඳවන්න. හැබැයි, උඩ ඉඳලා ප්‍රමුඛතා ලැයිස්තුවේ පිළිවෙළට මුල් වර්ෂවල අයට මුලින් දීලා ඒ පිළිවෙළට බඳවාගෙන එන්න. මේක අතිශය සාධාරණ ඉල්ලීමක්. මම හිතන්නේ අපේ ගරු මහ ඇමැතිතුමා මේ සිද්ධිය ගැන දන්නවා. ඒ අය කියන්නේ උපාධිධාරීන් විශාල පිරිසකට මෙයින් අසාධාරණයක් වෙනවා. ඒ වාගේම යම් දේශපාලන ක්‍රියාවලියක් හැටියට ඒ අය මේක දකිනවා. ඡන්දය ලබා ගැනීම සඳහා මීනුවන්ගොඩ පළාතේ, ගම්පහ පළාතේ ඒ පැත්තට ප්‍රමුඛතාවය ලබා දීමේ වැඩ පිළිවෙළක් විධියට මේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා කියලා. ඒ අයගේ අදහසක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, නමුත් මම එහෙම කියන්න සූදානම් වෙන්නේ නැහැ. නමුත් මෙහි පොඩි සාධාරණ ඉල්ලීමක් තිබෙනවා. ඔබතුමා ඕනෑ නම් ඒ අය මට ලබා දුන්න ඒ සාධාරණ ඉල්ලීම සඳහන් ලිපියේ පිටපතක් දෙන්නත් පුළුවන්.[3] – ඒ අවශ්‍ය සියලු පිටපත් මා ළඟ තිබෙනවා. මම ඒක සභාගත කරන්නම්. ගරු සභාපතිතුමනි, ඒ නිසා ඔවුන්ගේ ඉල්ලීම අතිශය සාධාරණ ඉල්ලීමක්. දේශපාලනය ගැන හිතන්නේ නැතිව, ගම්පහ ගැන හිතන්නේ නැතිව මුළු බස්නාහිර පළාතම ආවරණය වන පරිදි මේ උපාධිධාරීන්ට සාධාරණය ඉෂ්ට කරන්නය කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒකට උත්තර දෙන්න බැරි බව මම දන්නවා. නමුත් මාධ්‍ය මෙතැන ඉන්න නිසා මේකට පොඩි පැහැදිලි කිරීමක් කළොත් ඒක නිවැරදි කිරීම් කරන්න පුළුවන්. මොකද, ගරු මන්ත්‍රීතුමාත් වැරදි අවබෝධයක ඉන්නවාය කියලා තේරෙන නිසා. ඒ නිසා අවසරයක් දෙනවා නම් ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතුමාට මේ ගැන ගත හැකි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී විවාදයකට යන්නත් දෙන්න බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එතකොට ඔබතුමාට ඔය ආපු කෙනාට කියන්න පුළුවන්. ඔබතුමාට එහෙම අවශ්‍ය නම් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරි. එහෙනම් කියන්න කෝ ඔබතුමා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා එකඟ නම් මම ඒකට එන්නම්.

[3] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, ඒ විධියට සංවාදයක් ආරම්භ කරනවා නම් මේ කාරණය සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ. බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම සංවාදයකට එන්න කැමැති නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා පැහැදිලිව කිව්වා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අපටත් කාරණා තිබෙනවා ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අහගෙන ඉන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

එහෙමනම් අපටත් පොඩි වෙලාවක් දෙන්න. මේ කාරණයට වැඩිමනක් කාරණා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාවක් නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

දෙන්න තිබෙනවා. එහෙමනම් ඒකටත් පොඩි වෙලාවක් දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එහෙමනම් ඔබතුමා ඒකත් කියන්න. මම ඒකටත් එක්ක උත්තර දෙන්නම්. මොකද, උපාධිධාරීන්ට ඔබතුමන්ලා කරන්නේ ලොකු අසාධාරණයක්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මොකක් ගැනද කථා කරන්නේ?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

එහෙම අවස්ථාවක් දෙනවා නම්, දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. කථා කරන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමැතිතුමාටත් බැහැ. එතුමාටත් බැහැ. සභාවේ රීති ආරක්ෂා කරන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, රීති අංක 34(5) සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. සභාවේ බාහිරව ගරු මන්ත්‍රීවරයෙකු විසින් කරන ලද හෝ කියන ලද හෝ දෙයක් ගැන සාකච්ඡා, පැහැදිලි කිරීම් ඉදිරිපත් කළ නොහැකියි, පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නවා. මමත් කිව්වා. ගරු මහ ඇමැතිතුමාත් ඒ සම්බන්ධයෙන් කිව්වා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම ඒක දන්නවා. නමුත් මෙතැන මාධ්‍ය නිසා පැහැදිලි කිරීමක් -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු මහ ඇමැතිතුමා ඒකට උත්තර දෙනවා නම් ඊට කලින් පොඩි පැහැදිලි කිරීමක් අපටත් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ. ඒක කරන්න බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක දුන්නා නම් හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, මට විශේෂ ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව. ඇතුළේ මන්ත්‍රීවරු 104 දෙනෙක් ඉන්නවා. ඔබතුමාත් එක්ක ගරු ප්‍රධාන ඇමැතිතුමා, ඇමැති මණ්ඩලයේ 04 දෙනෙක් ඉන්නවා. අපේ ගරු විපක්ෂ නායකතුමා ඉන්නවා. විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඉන්නවා. ඇත්ත වශයෙන්ම අනෙක් ඔක්කෝම මහජන නියෝජිතයෝ. මමත් මේ සභාවට පත් වෙලා ඉන්නේ තුන්වැනි වරට. 2003 දී මම මේ සභාවට පත් වුණේ. 2015 වෙලත් මම මේ සභාවේ වාඩි වෙලා ඉන්නවා. ගරු සභාපතිතුමනි, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ගිය සභා වාර දෙකට වැඩිය මේ සභා වාරයේ ප්‍රශ්න ගොඩක් මතු වෙලා තිබෙනවා. ඒ කියන්නේ මේ පෞද්ගලික මාධ්‍ය - ඇත්ත වශයෙන්ම අපි මේ මාධ්‍යයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මහරාජා මාධ්‍ය ආයතනයෙන් ඇවිල්ලා මෙතැන සභාවක් වෙනවා කියලා රට TV එකේ පෙන්වනවා. ඒක හොඳ දෙයක්. මේ අය කරන හොඳ දේ අපි හොඳයි කියලා කියන්න ඕනෑ. මේ අය කරන නරක දේ නරකයි කියලා කියන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මෙතැන ඉන්න හතර පස් දෙනෙක්ව විතරයි මේ මාධ්‍යයෙන් ෆෝම් කරන්නේ. ඒක වැරැදියි. අපි මහජන නියෝජිතයෝ. අපි මෙතැනට පත් වෙලා ඇවිල්ලා තිබෙන්නේ ජනතාවගේ ඡන්දවලින්. එළියේ ඉන්න ජනතාව මේක කොහොමද තේරුම් ගන්නේ කියලා බැලුවොත්, මේකේ ඉන්න 98 දෙනාම ගොන්නු කියලා. ගොළුවෝ කියලා ඒ අය හිතනවා. මේකේ ඉන්න හතර පස් දෙනයි කථා කරන්නේ. මම හිතන්නේ, මහරාජා එකෙන්, සිරස ආයතනයෙන් මුදල් ගන්නවා ඇති. Job එකක් කරනවා ඇති. ඒක වෙනම දෙයක්. ඒක එළියේ තියාගන්න ඕනෑ දෙයක්. මාධ්‍ය සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ. මේක යහපාලනයක්. මට මතකයි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An Hon. Member

මාධ්‍ය සංදර්ශනයක්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගිය සුමානේ කුරුණෑගල රැස්වීමකදී අපේ ගරු අගමැතිතුමා මේක හොඳ ලස්සනට තේරුම් කරලා දුන්නා. මාධ්‍ය කරන වැරැදි ගැන. මේකත් වැරැද්දක්. මේක බරපතළ වැරැද්දක්. මම හිතනවා, එක් සභාවකදී අඩුම තරමින් මේ පැත්තේ 10 ක් 15 ක් කථා කරනවා. ඒ පැත්තෙන් 10 ක් 15 ක් කථා කරනවා. හැමදාම පෙන්වන්නේ මේ පස් හය දෙනා විතරයි. මේ අය කොන්ත්‍රාත්තුවක් කරන්නේ. (බාධා කිරීම්) මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න කෝ? මේ ගැන ඔබතුමන්ලා කථා කරන්නේ නැත්නම්, කථා කරන කෙනාට අවස්ථාව දෙන්න. මම ලස්සනට කථා කරන්නම්. ඇත්ත වශයෙන්ම ගරු සභාපතිතුමනි, මේ කරන්නේ කොන්ත්‍රාත්තුවක්. උදේට එනකොට සිරසේ, ශක්ති එකේ මොනවාද දාන්න ඕනෑ කියලා Agenda එකක් අතට භාර දෙනවා. ඒ Agenda එකට අනුව තමයි මේ අය මෙතැන කථා කරන්නේ.

ගරු සභාපතිතුමනි, මම අවුරුදු 35 ක ඉඳලා දේශපාලනය කරන මිනිහෙක්. මම 2001 නගර සභා ඡන්දයේදී අවුරුදු 03 ක් නගර සභාවේ ඉඳලා තුන්වැනි වාරේ මේ බස්නාහිර පළාත් සභාවට ඇවිල්ලා ඉන්නවා. අපි ඉස්සරහාට යන්න ඕනෑ කියලා අපටත් ආශාවක් තිබෙනවා. මට විතරක් නොවෙයි. මෙතැන ඉන්න 104 දෙනාටම ඒ ආශාව තිබෙනවා. මේ අය මොනවාටද කඩේ යන්නේ? ඇයි වැරැදි කරන්නේ? මේ අය එළියට ගිහිල්ලා විමධ්‍යගත මුදල්වලින් පුටු 06 ක් දුන්නා නම්, ඒ පුටු 06 ට TV එකක් අරගෙන ගිහිල්ලා දවස් තුනක ඒකත් පෙන්වනවා. වතුර ටැංකියක් දුන්නා නම් ඒකත් ලොකුවට පෙන්වනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මරික්කාර්ට සිරස ඡන්දය එකතු කරනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

TV එක ඇරියා නම්, මේ අයගේ මුහුණු විතරයි පෙන්වන්නේ. ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට මේ යොමු කරනවා. මේක විහිළුවක් කියලා ගණන් ගන්න එපා. ගරු සභාපතිතුමනි, මම ප්‍රධාන ඇමැතිතුමාටත් කියන්නේ වහාම මේක නතර කරන්න. මේක මෙතැනින් නතර කරන්න. මේක ඉස්සරහාට යන්න දෙන්න එපා. ඉස්සරහාට මහ මැතිවරණයක් බලාපොරොත්තුවෙන් අපි ඔක්කෝම ලැහැස්ති වෙලා ඉන්නවා. මෙතැනින් මොකක්ද වෙන්නේ? අපේ පැත්තේ ඉන්න මන්ත්‍රීවරු දෙන්නෙක් තුන්දෙනෙක්, ඒ පැත්තේ ඉන්න මන්ත්‍රීවරු එක්කෙනෙක් දෙන්නෙක් විතරයි හැමදාම පෙන්වන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මරික්කාර් විතරයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An Hon. Member

මේක නතර කරන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඒක වැරැදියි. මේක කරන්න බැහැ. හරි අසාධාරණයක් මේ කරන්නේ. තොරතුරු දැන ගැනීමේ අවශ්‍යතාවය හැම කෙනාටම තිබෙනවා. අපි පාරට ගියා නම්, අපේ ගමට අපි ගියා නම් ගරු සභාපතිතුමනි, රෑට TV එක බලලා මිනිස්සු අහන්නේ මොකක්ද දන්නවාද? ඔයගොල්ලන්ට අපි ඡන්දය දුන්නාට වැඩක් නැහැ. ඔයගොල්ලෝ කවුරුත් සභාවට යන්නේ නැහැ නේද කියලා. කට්ටිය ඔක්කෝම ගිහිල්ලා ගොළුවෝ වාගේ නේ ඉන්නේ. මෙතැන ඉඳලා කථා කරන්නේ එක්කෙනයි දෙන්නයි. සභාවේ වීරයෝ වාගේ කථා කරන්නේ දෙන්නයි තුන්දෙනයි. ගරු සභාපතිතුමනි, ඔබතුමා අණ කරලා මේ මාධ්‍ය ටික නරත කරලා කවුරු හරි මේ සභාවේ කථා කරනවාද ඒක පෙන්වන්න කියලා කියන්න. කථා කරන්නේ නැහැ. ලංකාවේ පළාත් සභා 09 ක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, කොයි සභාවේවත් වෙන්නේ නැති දෙයක් තමයි මේ බස්නාහිර පළාත් සභාවේ වෙන්නේ. එක සභාවකවත් මෙහෙම දෙයක් වෙන්නේ නැහැ. මේක හරි අසාධාරණයි. අපේ වරප්‍රසාද මේ නැති කරන්නේ. මේක වහාම නතර කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය පිළිබඳව මමත් පුංචි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මොකද, මමත් ඇත්ත වශයෙන්ම සභාපතිවරයා වශයෙන් ඒක අනුමත කරනවා. මේ සභාවේ මාධ්‍ය ස්වාධීනත්වයක් තිබෙන්නට ඕනෑ. විශේෂයෙන් මාධ්‍ය හැම මන්ත්‍රීවරයෙකුගේම ඒ අවශ්‍යතාවලට ඉඩ දෙන්නට ඕනෑ. සමහර වෙලාවට මාවත් පෙන්වන්නේ නැහැ. මගේ කට හඬ විතරයි ඇහෙන්නේ. මාව පෙන්වන්නේත් නැහැ. වෙන මන්ත්‍රීවරු පෙන්වන්නේ. බස්නාහිර පළාත් සභාවේ මූලාසනයේ ඉන්නේ සභාපතිතුමා. ඒ නිසා මම ඒ ගැන කනගාටු වෙනවා. මම ඒ මාධ්‍ය ආයතනයෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, එහෙම කරන්න එපා. ඔබතුමන්ලා සමබරව මාධ්‍ය පාවිච්චි කරන්න. නැත්නම් අනෙක් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙනවා. එහෙම නැත්නම් ඉදිරියේදී අපි ඒ ගැන තීන්දුවක් ගන්නවා. අනිවාර්යයෙන්ම ඔබතුමන්ලා සාධාරණව මේ පළාත් සභාවේ මාධ්‍ය හසුරුවන්නේ නැත්නම් - ගියවර සභා කටයුතු කාරක සභාවේදීත් අපි දෙපක්ෂයේම මන්ත්‍රීවරු කථා කළා. මට සිද්ධ වෙනවා, ඒ මන්ත්‍රීවරුන්ගේ අදහසට ගරු කරලා අනිවාර්යයෙන්ම ඔබතුමන්ලාට මාධ්‍ය ආවරණයක් ලබා දෙන්න.

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා අවස්ථාව.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, අපි දන්නවා පසුගිය කාලවකවානුවේ විශේෂයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මැදිහත්ව මේ රටේ පවතින නීතියට පටහැනිව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියක නිරත වුණා. මේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ අතුරු

ප්‍රතිඵලයක් හැටියට ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මහල් නිවාස යෝජනා ක්‍රම කිහිපයක් ඇති වුණා. ඒ මහල් නිවාස යෝජනා ක්‍රම අතර බොරැල්ලේ සිරිසර උයන, මෙත්සර උයන, ඒ වාගේම වැල්ලවත්ත මයුර පෙදෙසේ ලක් මුතු මහල් නිවාස යෝජනා ක්‍රමයන් වාගේ මහල් නිවාස යෝජනා ක්‍රම ඇති වුණා. ගරු සභාපතිතුමනි, මම කියන්නේ මේ මහල් නිවාස යෝජනා ක්‍රම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී මෙම ඉඩම්වල එවකට හිටපු පදිංචිකරුවන් අවුරුදු 60 ක්, 70 ක්, 80 ක්, 40 ක්, 30 ක්, 20 ක් වශයෙන්, ඒ ආකාරයේ පදිංචි වුණු ජනතාවක් සිටියේ. ඒ අයට ගරු සභාපතිතුමනි, ජාතික නිවාස කොමසාරිස්වරයාගෙන් ඔප්පුවක් තිබුණා. එහෙම නැත්නම් නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලබා දෙන ලද ඔප්පුවක් තිබුණා. එහෙම නැත්නම් කොළඹ මහ නගර සභාව මගින් ලබා දෙන ලද ඔප්පුවක් තිබුණා. එහෙම නැත්නම් අඩුම තරමින් තමන්ට පෞද්ගලිකව පරිහරණය කරන්න පුළුවන් ඔප්පුවක් තිබුණා.

හැබැයි, ගරු සභාපතිතුමනි මේ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේදී සිද්ධ වුණේ මොකක්ද? මේ අයට කිසිදු ගෙවීමකින් තොරව මීට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියක් ගියා. ඊට පස්සේ මොකක්ද වුණේ? මේ මහල් නිවාසවල බලහත්කාරයෙන් ඉඩම් අත්පත් කරගෙන ඒවායේ හිටපු ජනතාව දාන්න පටන් ගත්තා. ගරු සභාපතිතුමනි, එක තඹ සතයක් මේ අයට ගෙව්වේ නැහැ. මේ ඉඩම්වලට ගෙව්වෙත් නැහැ. මේ නිවාසවලට ගෙව්වෙත් නැහැ. තඹ සතයක් ගෙව්වේ නැහැ. ගෙව්වේ නැතිවා විතරක් නොවෙයි. ඔවුන් නිවාසවලට අවුරුදු 20 ක කුළීකාරයන් බවට පත් කළා. ඉතින් ගරු සභාපතිතුමනි, ඔවුන් රුපියල් 50,000/- වාරික දෙකක් ගෙවන්න ඕනෑ. ඊට අමතරව රුපියල් 3960/- වාරික අවුරුදු 20 ක් වනතුරු ගෙවන්න ඕනෑ. මේක බරපතළ අසාධාරණයක්. ගරු සභාපතිතුමනි, ඒ අය ජීවත් වුණේ බුලත්විට විකුණලා. එහෙම නැත්නම් ලැවරියා විකුණලා. තේ කඩයක් කරලා තමයි ගරු සභාපතිතුමනි මේ අය ජීවත් වුණේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කුඩු, ගංජා ඒවා නැතිව ගියා. එතැන දැන් පාතාලය නැහැ. කුණු නැහැ. කුඩු නැහැ. ගංජා නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන් පැහැදිලි කරන්නේ ඒ අයගේ ජීවනෝපාය ඇහිරුණා. ඒ අයට තිබුණු ආදායම අහිමි වී ගියා. එතකොට ගරු සභාපතිතුමනි, ඒ අයට දැන් කුළිය ගෙවා ගැනීමට හැකියාවක් නැහැ. ගරු ඇමැතිතුමා මෙතැන ඉන්නවා. ඔබතුමාගේ අවධානය යොමු කරන්නේ. මේ අයට ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරියට අදාළ කුළිය ගෙවා ගැනීමට හැකියාවක් නැහැ. දැන් කුළිය arrears වෙලා. එතකොට ගරු සභාපතිතුමනි, ඔවුන්ගේ ඉඩම අත්පත් කර ගැනීමට සතයක්වත් ගෙව්වේ නැත්නම්, ඔවුන් වාසය කරපු නිවසට සතයක්වත් ගෙව්වේ නැත්නම් ඔවුන් කුළිය ගෙවිය යුත්තේ ඇයි? ගරු සභාපතිතුමනි, මේක බරපතළ අසාධාරණයක්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මුඩුක්කුවට ගෙයක් දුන්නා නේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔබතුමන්ලාගේ අවධානය යොමු කරලා -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හිටියේ මුඩුක්කුවේ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. බාධා කරන්න එපා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, කුඩු විකුණනවා කියලා මන්ත්‍රීවරයෙක් කියනවා. කරුණාකරලා තමුන්නාන්සේලා මිනිස්සුන්ට අපහාස කරන්න එපා. බුලත්විට විකුණලා ජීවත් වෙන මිනිස්සු. ලැවරියා විකුණලා ජීවත් වන මිනිස්සු. ඒ මිනිස්සුන්ට කුළිය ගෙවා ගන්න විධියක් නැහැ. තමුන්නාන්සේලා විහිළු කරනවා. මම තමුන්නාන්සේගේ මාර්ගයෙන් ඉල්ලා සිටින්නේ, අදාළ විෂයය භාර අමාත්‍යවරයාට මීට අදාළ කටයුත්ත යොමු කරන්න. ගරු සභාපතිතුමනි, කුළිය සම්පූර්ණයෙන් මුදා හැරීමට අදාළ -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

යහපාලනයෙන් ඔක්කොම අයින් කරනවා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් අයින් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාගේ කාලය අවසානයි. දැන් ඉඳගන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඇමැතිවරු මොකටද ඉන්නේ?

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Electricity and Power, Provincial Roads, Housing and Constructions, Water Supply and Drainage, Social Welfare, Urban and Estate Infractructure Facilities)

මහ ආණ්ඩුවට කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පළාත් සභාවේ ඇමැතිවරුන්ට මොකටද ගෙවන්නේ? එහෙමනම් එයාලා ඉල්ලා අස්වෙලා යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලාට අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඇමැතිකම හොඳයි හේනේ කුරුල්ලෝ එලවන්න දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, අපේ පළාත් සභා මන්ත්‍රීවරුන් වෙනුවෙන් වෙන් කරන ප්‍රතිපාදනවල වැඩ කටයුතු කිරීමට පළාත් සභාව මගින් එක නිලධාරියෙක් කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට පත් කරලා තිබෙනවා. සැලසුම් අධ්‍යක්ෂවරයෙක්. මම හිතන්නේ අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරු පස් දෙනාගේම වැඩ ඉතාමත්ම හොඳට කාර්යක්ෂමව මෙතෙක් කල් කරගෙන ආවා. කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමා, එතුමාගේ මොළේ ආබාධයක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. හැම නිලධාරියා එක්කම රණ්ඩු කරනවා. හැම නිලධාරියෙකුගේම ෆයිල්වලට කොළ දානවා. ඒ ගොල්ලන්ගේ රැකියාවට විරුද්ධව. එතකොට මම හිතන්නේ, හැම කෙනාම කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන්නේ බොහොම බියෙන්. මම හිතන්නේ රෝස් ගරු මන්ත්‍රීතුමිය සාක්ෂි දරනවා. අපි ඔක්කොම ගිහිල්ලා කථා කරනවා. පස්සේ මාරු කරන්න කියලා ඒ නිලධාරියාට මෙහෙන් ලියුම් එවනවා. පස්සේ මෙහෙන් මාරු කිරීමේ ලිපිය යැව්වා. යැව්වාට පස්සේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියත්, පළාත් සභාවේ අනෙක් මන්ත්‍රීවරු පස් දෙනාම ඇවිල්ලා ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කළා. ගරු මහ ඇමැතිතුමා මේ නිලධාරීතුමා ඉතාමත් කාර්යක්ෂමයි. හොඳට වැඩ කරනවා. අපේ කටයුතු ටික කරනවා. මේ ප්‍රාදේශීය ලේකම්තුමා පළි ගැනීමක් කරන්නේ. ඒ නිසා මේ දේ කරන්න එපා. මේ මාරුවීම අවලංගු කරන්නය කියලා. පස්සේ අපේ ගරු මහ ඇමැතිතුමා ඒ අදාළ නිලධාරියාව කැඳවලා මේක සොයා බලලා දැනට පරීක්ෂණයක් පවත්වන තුරු තුන් මාසයකට දික් කරන්නය කියලා කිව්වා. තුන් මාසයකට දික් කරලා ඇරියට පස්සෙත්,ඒ ලිපිය ලැබිලා තිබෙද්දිත් ප්‍රාදේශීය ලේකම්තුමා එයාට ලියුම ලැබුණා කියලා කියන්නේ නැතිව ටක් ගාලා නිදහස් කරලා ලියුම දුන්නා. යන්න ඇරලා. ඊට පහුවෙනිදා එයා ආපුවාම ඉතිරි වැඩ ටික කරන්න, අත්සන් කරන්න දීලා තිබුණේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ අපේ පළාත් සභාවේ නැවත ඒ මාරු වීම Cancel කරලා ඇරියට පස්සේ, ඒ ලියුම ප්‍රාදේශීය ලේකම්තුමාගේ අතට පත් වුණායින් පස්සෙත් ඒ නිලධාරියාගේ වැඩ තහනම් කරන්නේ කොහොමද? ඉතාමත්ම කාර්යක්ෂම හොඳ නිලධාරියෙක්. ඔබතුමා මාර්ගයෙන් ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලන්නේ. ඒ නිලධාරියාගේ රැකියාව ස්ථාපිත කර දෙන්න. ඒ වාගේම එතුමාගේ රැකියාවේ අනාගතය ස්ථාවර කර දෙන්න. මොකද, මම දන්න විධියට ෆයිල් එකට ලියුම් දානවා කියලා කියනවා. අන්තිමට එතැන ඉන්න සමහර අය කිව්වා, එක්කෝ ඒ ප්‍රාදේශීය ලේකම් මාරු කරන්න. නැත්නම් මේ නිලධාරියාව මාරු කරන්න. නැත්නම් මේ ප්‍රාදේශීය ලේකම් හිටියොත් මේ නිලධාරියාට පෙන්ෂන් එකවත් හම්බ වෙන්නේ නැහැයි කියලා ඒ කරන අසාධාරණකම්වලට. ප්‍රාදේශීය ලේකම්ට මානසික ආබාධයක් තිබෙනවා කියලා මට හිතෙනවා. මොකද, හැම එක්කෙනා එක්කම රණ්ඩු කරනවා. කටාන ප්‍රාදේශීය සභාවේ පක්ෂ විපක්ෂ සෑම මන්ත්‍රීවරයෙක්ම ප්‍රාදේශීය ලේකම්ට විරුද්ධව මේ වන විටත් ලියුමක් අත්සන් කරලා රාජ්‍ය පරිපාලනය වෙත යවන්න ලැහැස්ති වෙලා තිබෙනවා. මේ ප්‍රාදේශීය ලේකම්තුමා මාරු කරන්න කියලා. මොකද, කිසිම දේශපාලන කටයුත්තකට, රාජකාරී කටයුත්තකට - දේශපාලන ඕනෑ නැහැ. රාජකාරී කටයුත්තකට සහයෝගය දෙන්නේ නැහැ. ඒක නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් මම අපේ ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ නිලධාරියාගේ රැකියාව ස්ථිර කරලා අපට සේවය ලබා ගන්න අවස්ථාව ලබා දෙන්නය කියලා. පළාත් සභා සේවකයෙක්. පළාත් සභා සේවකයෙකුගේ අයිතිය ගැන කතා කරන්න අපට අයිතියක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An Hon. Member

මහ ඇමැතිතුමාට බලතල තිබෙනවා නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු මහ ඇමැතිතුමා කිව්වත් AG කරන්නේ නැහැ. මහ ඇමැතිතුමා ලිපිය ඇරියා. එත් එයාට මොළේ අප්සට් එකක් නිසා ගණන් ගන්නේ නැහැ නේ සාමාන්‍යයෙන්. කවුරු කිව්වත්. රජෙක් කිව්වත් ගණන් ගන්නේ නැහැ. ඒක නිසා නැවත වතාවක් ඔබතුමා සොයා බලලා කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා. ස්තූතියි.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. අද ලංකාදීප පුවත්පතේ විශේෂයෙන්ම තිබෙනවා, ඩෙංගු කියා රෝගීන් 5885 ක් කළුබෝවිල රෝහලට ඇවිල්ලා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඕක කරන්න දෙන්න බැහැ. ඔබතුමාට ඕක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. ඔබතුමාට -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මම කියන්න යන්නේ අපේ බස්නාහිර පළාත් සභාවේ මේ බිල්ඩිමේ පිටිපස්සේ මෙතැනින් කුණු ඇළක් යනවා. මෙතැනින් යන මේ කුණු ඇළ - විශේෂයෙන් මම අද කථා කරන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මම කථා කරන්නේ මේ කාලයේ ඩෙංගු සීඝ්‍ර ලෙස වැඩි වෙලා තිබෙනවා. මෙතැන රෝගීන් 5885 ක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පැහැදිලියි. ඔබතුමා මට -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

කළුබෝවිල රෝහලට ඇවිල්ලා තිබෙනවා. එතකොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා පුවත්පත් දැන්වීම්වලට මට අවස්ථාව දෙන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම විනාඩියක් ගන්නේ, අපේ පළාත් සභාවේ එහා පැත්තේ තිබෙනවා කුණු ඇළක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා සමාවෙන්න. අපි ඒක සොයා බලන්නම්.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

කරුණාකරලා ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරුන් විතරක් නොවෙයි. මෙතැන ඉන්න සේවක පිරිසත්, මේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පැහැදිලියි. මම ඒ ගැන සොයා බලන්නම්.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

කරුණාකරලා මේ ඇළ මාර්ගය, අඩුම ගණනේ මේ පළාත් සභාවේ පිටිපස්සේ තිබෙන ඇළ මාර්ගය ශුද්ධ කරන්න කියන ඉල්ලීමයි මම කරන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මා ජීවත්වන දෙහිවල ප්‍රදේශයේත් අර හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කියපු කාරණයමයි. ඒ ප්‍රදේශයේත් ඩෙංගු ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම මා පදිංචි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපි නගර සභාවෙන් ඉල්ලීම් කරනවා. හැබැයි නගර සභාව දූම් ගහන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, වරප්‍රසාද ප්‍රශ්නයක් නොවේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

පළාත් සභා විෂයය පථයට අයත්.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

දැන් ජනාධිපති කාර්ය සාධන බලකාය තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් අපේ පළාත් සභාව ඒකට වගකියන්න ඕනෑ. ඒ නිසා ඔබතුමා හැසිරෙන්නේ අපට කථා කරන්න දෙන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කරන්න දෙන්න බැහැ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අසාධාරණයි. අපට වරප්‍රසාද ප්‍රශ්න මතු කරන්න අවස්ථාව තිබෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙන්න බැහැ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපට කථා කරන්න අවස්ථාවක් තිබෙනවා නේ. අපට වරප්‍රසාද ප්‍රශ්න අහන්න දෙන්නේ නැහැ නේ? මේක මාර වැඩක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. ඔබතුමා එක පාරට ඇවිල්ලා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

වරප්‍රසාද ප්‍රශ්න කථා කරන්න අවස්ථාව නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒක තමයි කියන්නේ. ඔබතුමා මට කියන්න දෙන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ දෙහිවල ප්‍රශ්න මෙතැන කියන්න එපා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

දෙහිවල ප්‍රශ්න මේ පළාත් සභාවට අයිති විෂයයක් නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති විරෝධි ලෙස මෙතැන ප්‍රශ්න කථා කරන්න දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මම කියන්නේ, දැන් මම ඉන්න ප්‍රදේශයේ ඩෙංගු මදුරු ව්‍යාප්ත වෙලා තිබෙනවා. පළාත් පාලන ආයතන ඒවා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, ඒක පළාත් සභාවේ වගකීමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙන වෙන පැහැදිලි කිරීම් කරන්න මට දෙන්න බැහැ. ඔබතුමා කරුණාකර වාඩි වෙන්න. අනවශ්‍ය ප්‍රකාශ කරන්න දෙන්න බැහැ, ඔබතුමාට. කරුණාකර වාඩි වෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

පළාත් සභා විෂයය පථයට අයත් එකක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාවට ගරු කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

පළාත් පාලන ආයතනය සම්බන්ධ ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කරපු කරුණාවක් සම්බන්ධයෙන් විෂයය භාර ඇමැතිවරයා හැටියට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. නැත්නම් ඒ පිළිබඳව වැරදි අවබෝධයක් යනවා. ගරු සභාපතිතුමනි, උපාධිධාරී පත්වීම් සම්බන්ධව. මම එතුමාට මතක් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, සමාවෙන්න. ඔබතුමා කථා කරන්නේ අර -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බැහැ. බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, පැහැදිලි කිරීමක් නොවේ. වරප්‍රසාද ප්‍රශ්නයක්. 36 (1) යටතේ. ඔබතුමා කරපු -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මොකක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අපේ අමාත්‍යාංශය යටතේ ගැනෙන කාරණාවක් බැවින්, ගරු සභාපතිතුමනි. ඒ විෂයය භාර ඇමැතිවරයා මම. මේක පැහැදිලිව 36(1) යටතේ ඔබතුමා කියවලා බලන්න. ඒක බලලා ඇවිල්ලා තමයි මම මේ කථා කළේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක බලලා නොවෙයි. ඔබතුමා මම දීපු කොළේ බලලා ඇවිල්ලා දැන් මේ කථා කරන්නේ .

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

සමාවෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතුමාට අවස්ථාවක් දෙන්න ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

තරහා ගන්න එපා. හොඳට හිනා වෙලා ඉන්න. ලේ පුච්ච ගන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා විෂය භාර ඇමැතිවරයා වශයෙන් එතුමාට අදාළව ප්‍රශ්නයක් කතා කරන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි,-

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා ඉදිරිපත් කරන්න කෝ. ඇයි දැන් ඔබතුමා තරහා ගන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 36(1) හා 36(2) යටතේ මට කථා කරන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා තරහා ගන්න එපා. හිනා වෙලා අපි කථා කරමු. ලේ පුච්ච ගන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා දන්නවා, ඔබතුමන්ලා අතින් වැරැද්දක් වුණයි කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අනේ නැහැ. මම ඒක පැහැදිලි කරන්නම්. ගරු සභාපතිතුමනි, මෙතුමා කියපු කාරණාව සම්බන්ධව 2012 –

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එහෙම එකක් නැහැ. ඔබතුමාට අවසර දෙන්න පුළුවන්කම තිබෙන්නේ සභා රීතිවල තිබෙන ප්‍රතිපාදන යටතේ නේ. 36(1) හෝ 36(2) යටතේ මේ කියන වරප්‍රසාදය නැහැ, අදාළ පැහැදිලි කිරීම සම්බන්ධයෙන්.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

එතුමාගේ කාරණාවට මම පැහැදිලි කිරීමක් කරන්නේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අදාළ පැහැදිලි කිරීම සම්බන්ධයෙන් ගරු මහ ඇමැතිතුමාට 36(1) හෝ 36(2) යටතේ, ඒ පැහැදිලි කිරීම

සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීමකට මන්ත්‍රී වරප්‍රසාද කඩවීම සම්බන්ධයෙන් ඉඩක් නැහැ. ඔබතුමා හොඳින් බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මට පස්සේ නේ කතන්දරේ තේරුනේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම මන්ත්‍රීවරයෙක්. මම ඇමැතිවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂයය භාර ඇමැතිවරයා වශයෙන් එතුමා ඉල්ලීමක් කරද්දී මම ඒකට ඉඩ දෙන්න ඕනැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ කාරණය සම්බන්ධයෙන් **-යෝජ්‍ය**

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

සභාපතිතුමා පක්ෂපාතී වෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේ සභාව නොමග අරිනවා. 36(1) නොවෙයි මේ. වරප්‍රසාද කියන්නේ 36(2). 36(1) කියන්නේ විශේෂ ප්‍රකාශ. මේ 36(2) යටතේ කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පුළුවන් එතුමාට අවස්ථාව දෙන්න. ගරු මහ ඇමැතිවරයා වශයෙන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු මහ ඇමැතිවරයා කථා කරන්නේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් වුණු වැරැද්දක් සම්බන්ධයෙන්. 36(1) තිබෙන්නේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු සම්බන්ධයෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් මෙතුමා ඇමැතිවරයෙක්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම මන්ත්‍රීවරයෙක් නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික වරප්‍රසාද කඩවීම සම්බන්ධයෙන් විතරයි 36(1). 36(2) කියන්නේ. ඒ අදාළ ප්‍රවෘත්තිය, කාරණයට අදාළව මාධ්‍ය සම්බන්ධයෙන් විතරයි. අමාත්‍යාංශය සම්බන්ධයෙන් වේවා. එහෙම නැත්නම් ඇමති කෙනෙක් විධියට වුණු කඩවීම සම්බන්ධයෙන් 36(1), (2) කියන්නේ නැහැ. මේකට අවසර දෙන එක වෙනමම දෙයක්. හැබැයි, අවසරදීම හුවා දක්වන්න හදන්නේ සභා නීති රීති වෙනත් ආකාරයකට අර්ථ කථනය කිරීමෙන් නම් ඒක වැරැදියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ තිබෙන කාරණා මාධ්‍යයට යයි කියලා හයේ අද මෙතුමාට ඕනැ වෙලා තිබෙනවා, මේකේ තිබෙන කාරණාවලට උත්තර දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙතුමාද රීති ප්‍රශ්න නඟන්නේ. කලින් කථා කළ -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා සන්තෝෂ වෙන්න එපැයි. උත්තරයක් දෙන එකට.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔබතුමාගේ අවසර දීම සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා විෂයය භාර ඇමැතිවරයා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අවසර දීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නෙවෙයි තිබෙන්නේ. රීතිය විකෘති කරමින්, ඒ රීතිය ප්‍රයෝජනයට ගනිමින් කථා කිරීම වැරැදියි.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපි මහ ඇමැතිතුමාගේ උත්තරය අහමු කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඇමැතිවරයෙක් වශයෙන් ප්‍රකාශයක් කරන්න අවස්ථාව දෙන්න පුළුවන්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම පැහැදිලි කරන්න ඕනෑ. මෙතුමා කියපු කාරණාවේදී අපි 2012 දෙසැම්බර් 31 දක්වා උපාධිධාරීන්ව කැඳවන්න පුවත්පත් දැන්වීමක් පළ කළා. ඒ පළ කරනකොට ඊට ප්‍රථම - ගරු ඔබතුමා මාර්ගයෙන් මන්ත්‍රීවරු දැනුවත් කරන්න ඕනෑ. අපේ පළාත් සභාවේ ඌනධාරී උපාධිධාරීන්ව මේ ධුරයට පත් කරන්න පුවත්පත් දැන්වීමක් දාලා ඒ අයට පත්වීම ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා, ඊළඟට තිබුණු පුරප්පාඩු සඳහා. අපි දන්නවා, 2012.12.31 දක්වා මේකට ඉල්ලුම් කරන්න අවස්ථාව දුන්නා. 2012 දක්වා ආපු ඉල්ලුම්පත් ප්‍රමාණය අපේ පුරප්පාඩු ප්‍රමාණයට වඩා වැඩියි. එහෙම වුණොත් විභාගයක් තියන්න වෙනවා. ඔබතුමන්ලා කියනවා නම් මම ඒ විභාගය තියන්න ලැහැස්තියි, ගරු සභාපතිතුමනි. හැබැයි, ඒකේ වගකීම ඔබතුමන්ලා භාර ගන්න ඕනෑ. මොකද, -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පුවත්පත් දැන්වීමක් දාන්න කලින් එකේ -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක තමයි මම කියන්න යන්නේ. පොඩ්ඩක් ඉන්න. මම මේ 2011 වනතුරු බස්නාහිර පළාතේ ඉන්න රැකියාවක් නොමැති සෑම උපාධිධාරියෙකුටම රැකියාවක් ලබා දීමේ වැඩ පිළිවෙළක් තමයි ගරු සභාපතිතුමනි මේ ආරම්භ කළේ. ගරු සභාපතිතුමනි, 2011 ගම්පහ ළමයින් වැඩියි නම් 2012 ත් ඒකමයි මට්ටම. හේතුව වැඩියෙන්ම උපාධිධාරීන් එන්නේ ගම්පහ දිස්ත්‍රික්කයෙන්. ඒක ගරු මන්ත්‍රීතුමාගේ දැන ගැනීම සඳහා මම කියන්නම්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි අනික් පළාත්වල එකතු කරලා පෙන්නන්නම් කෝ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

හරි. අනික් පළාත් නැහැ. මම කථා කරන්නේ බස්නාහිර පළාතේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බස්නාහිර පළාතේ තමයි. අනික් දිස්ත්‍රික්කවලත් ඕනෑ තරම් උපාධිධාරීන් ඉන්නවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කථා කරන්න. මම ඔබතුමාට වගකීම භාර දෙනවා. ගරු සභාපතිතුමනි, මම ඒ අභියෝගය ගරු මන්ත්‍රීතුමාට භාර දෙනවා. 2011 දෙසැම්බර් 31 දක්වා සියලු දෙනාට අපි ඒ අවස්ථාව දෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විභාගය තියන්නේ කොහෙන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

විභාග දෙපාර්තමේන්තුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

විභාගයක් තිබුණාම ලකුණු මට්ටම අඩුවෙන් ගන්න ළමයින්ට ඒ අවස්ථාව අහිමි වෙනවා. ඒ නිසා මට උවමනාව

තිබෙන්නේ මේ කාරණාවේදී - 2011 වනතුරු - මගේ වැඩ පිළිවෙළට ඔබතුමන්ලා විරුද්ධ නම් විරුද්ධයි කියන්න. ඊළඟට මම උපාධිධාරීන්ව දැනුවත් කරන්නම්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මමත් ප්‍රධාන ලේකම්තුමියගෙන් විමසීමක් කළා. හේතුව පුවත්පත් දැන්වීමේ දානවා, 2012 කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

පොඩ්ඩක් ඉන්න. මම ඉවර නැහැ. ඉවර වුණාට පස්සේ ඔබතුමන්ලා කියන්න. ගරු සභාපතිතුමනි, එතකොට 2011 දෙසැම්බර් 31 වනතුරු අපි මේ සම්මුඛ පරීක්ෂණය තිබ්බාම අපි දන්නවා, එන ප්‍රමාණය කොපමණද කියලා. ඊට පස්සේ ඒ කොටසට පත්වීම් දුන්නාම ඇතිවන පුරප්පාඩුවලට මේ පුවත්පත් දැන්වීමෙන්ම 2012 දෙසැම්බර් 31 දක්වා අයටත් අපි ලබා දෙන්න කටයුතු කරනවා. ඒ කටයුතු කරන එක, වගකීමෙන් මම මේ සභාවේ කියනවා. 2012 දෙසැම්බර් 31 දක්වා අයටත් මේකේදී අවස්ථාව ලැබෙනවා. ඒ වාගේම 2014 දෙසැම්බර් මාසයේ තිබුණු ගුරු විභාගයට ප්‍රතිඵල පැමිණි ගමන් - අපි දැන් මුළු කලාප මට්ටමෙන් යනවා. විෂයය බද්ධව ඇතිවන පුරප්පාඩු සඳහා අපි විභාග ප්‍රතිඵල ආපු ගමන් ඒ අයට පත්වීම් ලබා දෙන කොට මෙතැන ඇතිවන පුරප්පාඩු ප්‍රමාණය බැලුවොත් 2012 නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. 2013 ටත් අපි උපාධිධාරීන්ට පත්වීම් ලබා දෙන්න කටයුතු කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමන්ලා පුවත්පත් දැන්වීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු ඇමැතිතුමා විවාදයකට යන්න අවස්ථාව දෙන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, දැන් මේ ඇතිවන පුරප්පාඩු ප්‍රමාණයෙන් 2012 එක කණ්ඩායමකට තමයි මේ පත්වීම් ටික, ඉතුරුවන හිඩැස් තියෙන ප්‍රමාණයට තමයි 2012 න් දෙන්න ඔබතුමා යෝජනා කරන්නේ. එතකොට ඒක තෝරගන්න ගියාම, ඒ තෝරා ගැනීමේ ක්‍රමවේදය අපට උපාධිධාරීන් තෝරාගන්න ගියාමත් දේශපාලන ක්‍රියාවලියකට යයි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඇයි නැත්තේ. ඒක තමයි වෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ ඊළඟ ඡන්දයට ලැහැස්ති වෙනවා. ඒක තමයි මේ ඇත්ත කතන්දරය.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එහෙමනම් ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාට තිබුණා, 2012 ටිකත් Interview කරලා ඔක්කෝම දාන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

Interview කරලා එක සැරේ දාන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ. ඒක කරන්නේ නැහැයි කියලා ලේකම්තුමිය කියන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මීනුවන්ගොඩටයි, ගම්පහටයි වැඩි තැනක් දීලා කියලයි මේ ළමයින්ගේ චෝදනාව තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ කාරණාව සම්බන්ධයෙන් අදහස් දක්වන්න ඔබතුමන්ලාට වෙනම කාලය දෙන්න පුළුවන්. දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්න ඕනෑ නම් යෝජනාවක් වශයෙන් ගෙනෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මට මතක විධියට පසුගිය දෙසැම්බර් මාසයේ 03 වැනිදා. දෙසැම්බර් මාසයේ 02 වැනිදා අධ්‍යාපන වැය ශීර්ෂයේදී ලිපියක් සභාගත කිරීම සම්බන්ධයෙන් රිවිර පුවත්පතේ වැරැදි ප්‍රවෘත්තියක් පළ වෙලා තිබුණා. මම එය වරප්‍රසාද ප්‍රශ්නයක් ලෙස මතු කළා. නමුත් අද 2015 මාර්තු මාසයේ තුන්වැනිදා. දැන් මාස තුනකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. මේ වනතුරු මේ සම්බන්ධයෙන් නිවැරැදි කිරීමක් මා දන්නා තරමින් පළ වෙලා නැහැ. ඉතින් පුවත්පත් දැන්වීමක් මාස හතරක්, පහක් ගිහිල්ලා ඒක නිවැරැදි කළාට ප්‍රයෝජනයක් නැහැ. මොකද ඒ වෙනකොටත් මගේ වරප්‍රසාද කඩවෙලා ඉවරයි. ඒක ක්ෂණිකව සිදු විය යුතු දෙයක්. එය සිද්ධ වෙලා නැහැ. අර පෞද්ගලික ලේකම්තුමාගේ සිද්ධියක්. එය මේ පුවත්පතේ පළ වෙලා තිබෙන්නේ, මම විසින් ව්‍යාජ ලිපියක් සභාගත කළාය කියලා හැඟෙන පරිදි. ඒ නිසා මෙය නිවැරැදි කිරීම කඩිනමින් සිදු කළ යුතුව තිබුණා. නමුත් එය මෙතෙක් සිදු වෙලා නැහැ. ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මටත් මතකයි ඔබතුමාගේ ඒ කාරණාව සම්බන්ධයෙන්. වරප්‍රසාද ප්‍රශ්නයක් වශයෙන් මතු කළා. මම ඒ සම්බන්ධයෙන් කනගාටු වෙනවා. මාධ්‍ය නිවැරැදි කිරීමක් සිද්ධ වුණේ නැහැ.

සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා, අධ්‍යාපන ක්ෂේත්‍රය සහ වත්මන් දේශපාලන තත්ත්වය පිළිබඳව පැහැදිලි කිරීමක්. විනාඩි 05 ක කාලයක් ඔබතුමාට තිබෙනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, බල්ලෙක් පූසෙකුටවත් මධුසමයේ කරදර කරලා නැති හින්දා අපි මේ යහපාලන ආණ්ඩුවේ දින 100 මධුසමයට කිසිම බාධාවක් කරන්න නොවෙයි හිතාගෙන සිටියේ. නමුත් 6% ක් අධ්‍යාපනයට වෙන් කරනවා කියලා බලයට පත් වුණු මේ ආණ්ඩුව පළමුවෙන්ම බෙල්ල මිරිකලා තිබෙන්නේ අපේ ළමයින්ගේ අධ්‍යාපන ක්ෂේත්‍රයට. අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ආසනයෙන්, ආසනයට ලක්ෂ 50, කෝටි 50, කෝටි 1000 –

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

පස්සේ දොරෙන් පැනලා ගියේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අදාළ නැහැ. කථා කරන්න දෙන්න කෝ. ඒක ප්‍රශ්නයක් නැහැ. මුදල් දීලා (බාධා කිරීමක්) – සිරසට දා ගන්න කො කෑ ගහන්නේ නැතිව. අද පරක්කු වෙලා ඇවිල්ලා දා ගන්න නැතිවද කෑ ගහන්නේ. සිරසට ගිහිල්ලා දා ගන්න. කලිසම ගලෝලා හිටගෙන හිටියා නම් දායි.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒක මම දාගන්නම්.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

කෑ ගහන්නේ නැතිව ඉන්නවා අයිසේ පොඩ්ඩක්.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඇත් පැටව් ගැන කථා කරන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මට ඇත් පැටව් නැහැ. (බාධා කිරීම්) ඒ නිසා අපි එහෙම බාධා කරන්න ගියේ නැහැ. මේ දීපු මිලියන - ඒ නිසා අපි එහෙම බාධා කරන්න ගියේ නැහැ. එක ආසනයට දුන්නා

ලක්ෂ 5000 ක්. 10,000 ක්. 8000 ක්. මෙහෙම හැම ආසනයකටම දුන්නා. අපේ මහරගම ආසනයේ විතරක් - (බාධා කිරීම්) නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වැදගත් මන්ත්‍රීවරයෙක්. ඒ නිසා ඔබතුමන්ලා පටන් ගත්ත පාසල. මහරගම ජනාධිපති විද්‍යාලය. ඒ නිසා ඔබතුමාටත් වගකීමක් තිබෙනවා. ලක්ෂ 280 ක් දීලා පන්ති කාමර හතරක් කඩලා මුල් ගල තියලා ඉදි කරන්න ආරම්භ කරන්න පටන් ගත්තා විතරයි. ගිවිසුම් අත්සන් කරලා, ටෙන්ඩර් දාලා. අද ඒ මුදල් නවත්වලා තිබෙනවා. පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ ලක්ෂ 100 ක් දීලා ආරම්භ කරපු ගොඩනැගිල්ලේ අතරමග වැඩ නවත්වලා තිබෙනවා. මහරගම ආසනයේ විතරක් අපි මේ කියන්නේ. බාලදක්ෂ මූලස්ථානයේ ලක්ෂ 50 ක් දීලා ගිවිසුම් අත්සන් කරලා වැඩ පටන් අරන්, අද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයක් නැහැයි කියලා නවත්වලා තිබෙනවා. මොරටුව Prince of Wales විද්‍යාලයේ ලක්ෂ 600 ක් දීලා ජල තටාංගයක් ඉදි කරන්න පටන් ගත්තා. ඒවා නවත්වලා. මේ ආදී ලෙස ලංකාවේ හැම දිහාවේම කෝටි ගණනක් වියදම් කරලා පටන් ගත්ත වැඩවල මුදල් නවත්වලා. මම අහන්නේ, ඒ ආණ්ඩුවට සල්ලි තිබුණා නම්, ඇයි? මේ ආණ්ඩුව සල්ලි ටික ගිල්ලාද? කොහේ හරි යහපාලනයෙන් මේ කරන ලද වරදට සමාවක් දෙන්න පුළුවන්කමක් නැහැ. මේ මුදල් ආර්ථික අමාත්‍යාංශයේ නැත්නම් ඒ මුදල් තිබෙන වැය ශීර්ෂයක්, විෂය පථයක් තිබෙන්න ඕනෑ. ඒ නිසා - (බාධා කිරීම්)

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

වැරදි ඇස්තමේන්තු නිසා ඒවා නවත්වලා තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒකේ වෙලා තිබෙන්නේ, හොරකම් ටික Evaluate කරන එක නතර කරලා තිබෙන්නේ. හොරකම් ටික Evaluate කරලා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඒ ඇස්තමේන්තු හැදුවේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. (බාධා කිරීම්) නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පාර්ලිමේන්තුවේ ඉඳන් ආපු වැදගත් මහත්මයෙක්. ඔබතුමා මේවාට අහු වෙන්න එපා. වැදගත් විධියට මේවා ඔක්කොම ඇස්තමේන්තු කළේ අපේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් තමයි ඇස්තමේන්තු කළේ. මේවා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ඇස්තමේන්තු කළේ නැහැ. ඒ නිසා තමන්ගේ වුණු වැරැද්ද අනුන්ගේ පිට පටවන්න එපා. මේ අධ්‍යාපනයේ බෙල්ල හිර කරන්නේ නැතිව මේ සියලු පාසල්වලට මේ වෙලා තිබෙන අසාධාරණය නිවැරදි කරන්න. ඒ සියලු මුදල් ලබා දෙන්නය කියලා අපි ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තමයි අපි ගරු කරන අපේ ජනතා විමුක්ති පෙරමුණ එළියට බැස්සා පෞද්ගලික අංශයට රු. 2,500/- ක් දෙන්න කියලා. රු. 2,500/- ක් නොවෙයි. ඇයි? පෞද්ගලික අංශයේ මිනිස්සු කඩේ ගියාම අඩුවෙන් දෙනවාද? පෞද්ගලික අංශයට භාගෙටද දෙන්නේ. රජයේ සේවකයන්ට වැඩියෙන් දීලා පෞද්ගලික අංශයට අඩුවෙන්ද දෙන්නේ. නැහැ. අපි කියන්නේ සම සේ ඒ පඩිය වැඩි කරන්න ඕනෑ. 2500 ක් නොවෙයි. රජයේ සේවකයන්ට රු. 5000/- ක් වැඩි කළා නම්, ඒ 5000 ම දෙන්න ඕනෑ. මොකද, කඩයකට ගියාම පාන් ගෙඩිය බාගෙටද ගන්නේ. 2500 ට කරන්න පුළුවන්කමක් නැහැ. සම්පූර්ණ මුදල ලබා දෙන්න ඕනෑ. එහෙම කියලා තමයි මේ යහපාලන ආණ්ඩුව ආවේ. මෙතුමා දැන් කිව්වා, ගෙවල් කුලී ගෙවන්න ඕනෑ නැහැ. මේ සියල්ල අයින් කරනවාය කියලා කිව්වා. නාගරික සංවර්ධන අධිකාරියෙන් දීපු ගෙවල්වල අපි අසාධාරණය සාධාරණීකරණය කරනවාය කිව්වා. මේ අපේ එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමාත් කිව්වා. අපි මේවා ගන්නේ නැහැයි කියලා කිව්වා. (බාධා කිරීම්) සියල්ල ගන්නේ නැහැයි කිව්වා. ඇයි ඉතින් ගන්නේ මොකටද? එකතු කරන්න එපා. අපි කියන්නේ, ගෙවන්න එපා. මේ වාගේ අසාධාරණකම් කරනවා. යහපාලනය කිය කියා මේ කරන එක වැරදියි. අපි කරනවා. අපි වැරදියි නේ? වැරදිකාරයෝ වැරදි කළාට කමක් නැහැ. හැබැයි, හාමුදුරුවෝ කෙනෙක් වැරදි කරන්න බැහැ. ඒ නිසයි මහණ වෙන්නේ. හැබැයි, මහණ වෙනවා වාගේ පෙන්වලා හක්කේ බුදුරුස්, බොක්කේ දඩ මස් තියාගෙන මේ කරන යහපාලනයට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි. ඒ නිසා මේ යහපාලන ආණ්ඩුව මේ ගෙනියන වැඩ පිළිවෙළ අපට අනුමත කරන්න බැහැ. අපි ඉල්ලා සිටිනවා, මේ අපේ දීපු සියලු මුදල්, අපේ කපපු සියලු මුදල් අපට නැවත ලබා දෙන්න කියලා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, සභවේ ගණපූරණය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. කරුණාකර සීනුව නාද කරන්න.

***සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති නොවූයෙන් ගරු සභාපතිතුමා විසින් රැස්වීම තාවකාලිකව අත් සිටුවන ලදින් පූ.භා. 11.50 ට යළිත් රැස් විය.***
*Committee counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*
*Later, It found no quorum Mr. Chairman, suspended the sitting and it resumed at 11.50 a.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාට, නැවතත් අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

බොහොම ස්තුතියි. ගරු සභාපතිතුමනි, අපි ඉල්ලීමක් කරනවා. මේ පෞද්ගලික පැහැදිලි කිරීම යටතේ අපේ මේ යහපාලන ආණ්ඩුවෙන් අපේ මේ අධ්‍යාපනයෙන් 6% ක් වෙන් කරනවාය කියලා ඇවිල්ලා, අපේ මේ අධ්‍යාපන ක්ෂේත්‍රයට වෙන් කරපු ඒ දැවැන්ත මුදල් සම්භාරය කපලා, මහරගම ජනාධිපති විද්‍යාලය ඇතුළු මේ සියලු විද්යාලවලට - අපි මේ යහපාලන මධුසමය නිසා මුකුත් කරන්නේ නැහැ. මේ ළමයි, දෙමව්පියෝ පාරට බැස්සාම - ඒ ළමයින්ට ඉන්න තැන අහිමි කරලා, ඒ ගොඩනැගිලි භාගයට කඩලා හදන්න පටන් ගත්ත ඒ සියලු දේවල්වල මුදල් නැවත ලබා දීලා නැවත එය ශක්තිමත් කරන්නය කියන ඉල්ලීම කරනවා. මොකද, එසේ නොමැති වුණොත් අපට සිද්ධ වෙනවා, මධුසමය කියලා බලන්නේ නැතිව මීට වඩා තීන්දුවලට යන්න. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ, කහ අඩු කරන්න, කොත්තමල්ලි අඩු කරන්න, තිරිඟු පිටි, මුං ඇට අඩු කරන්න මේ දෙන මුදල් කපනවා නම්, මේ ලබා දුන් මුදල් නොදෙනවා නම් මේක නොවෙයි යහපාලනය. ඉතින් අපටත් පුළුවන් මේ දේ කරන්න. මේකට ආණ්ඩුවක් වෙනස් කරන්න වුවමනාවක් නැහැ. සංවර්ධන කටයුතුවලට දීපු, අධිවේගී මාර්ග, ප්‍රාදේශීය සභා මාර්ග හදන්න දීපු මුදල් කපලා මේ බොන්න දෙන්නේ කොත්තමල්ලි නම් අපි ඒකට එකඟ වෙන්නේ නැහැ. ඒ නිසා අපි විශ්වාස කරනවා පෞද්ගලික අංශයේ පඩි වැඩි කරයි කියලා.

ඒ වාගේම අපේ පසුගිය ආණ්ඩුවෙන් අනියම්, කොන්ත්‍රාත් සේවකයන් ස්ථිර කරනවාය කියලා ප්‍රතිඥාව දීලා, අයවැයෙන් ප්‍රකාශයට පත් කළා. ජල සම්පාදන මණ්ඩලය, ඒ වාගේම විදුලිබල මණ්ඩලයට - මෛත්‍රීපාල සිරිසේන ගරු ජනාධිපතිතුමා විදුලි බල මණ්ඩලය ඉස්සරහාට ඇවිල්ලා පොරොන්දුවක් දුන්නා. අපි ස්ථිර කරනවාය කියලා. ඉතින් අද වන තෙක් ඒවා ස්ථිර කරන්න කටයුතු කරලා නැහැ. මේ සියල්ල නවත්වලා නම් මේ යහපාලනය ගෙනියන්නේ, අපි ඒවාට එකඟ වෙන්නේ නැහැ. මේ ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා. අර මල්පෝච්චි ටිකට වතුර ටික දා ගන්න බැරි ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙනවා. අර අරලිය ගහ මන්දිරය ඉදිරිපිට තිබෙන මල්පෝච්චි ටික අයින් කරනවා. (බාධා කිරීම්) ඉතින් මල්පෝච්චි ටිකට වතුර දා ගන්න බැරි නම්, මේක ආණ්ඩුවක් නොවෙයි. පාණ්ඩුවක් හදලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බල්ලන්ට කිරි පොවන්නද කියන්නේ. ළමයින්ට කිරි නැතිව ඉන්න කොට.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මේ යහපාලන ආණ්ඩුව පලවා හරින්න, පරාජය කරන්න කටයුතු කරනවා කියලා මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, ලෝක අවිහිංසාවාදයේ පීතෘෘන් වහන්සේ ඉන්දියාවේ හින්දු

භක්තික මහත්මා ගාන්ධිතුමන්. ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ ඉතාමත් ධර්මිෂ්ට සමාජයක් නිර්මාණය කිරීම සඳහා අනේකවිධ දුක් පීඩා වින්ද අනගාරික ධර්මපාලතුමා ඉන්දියාවේදී මියැදෙන්නේ තමන්ගේ හිස ශ්‍රී ලංකාව දෙසට නැඹුරු කොට අවසන් කටයුතු කරන්න එපාය කියන යෝජනාව ඉදිරිපත් කරමින්. ගරු සභාපතිතුමනි, කළුතර දිස්ත්‍රික්කයෙන් බිහි වුණු ඉතාමත් ශ්‍රේෂ්ට දේශපාලඥයෙක්. අප අතර අද නැති නිදහස් අධ්‍යාපනයේ පිතෘෘන් වහන්සේ හැටියට අපි සලකන ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමන්. එතුමාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ තමයි අද ගුරු පරපුර සමස්තයක් හැටියට බැලුවොත් විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබලා, මිෂනාරි අධ්‍යාපනයෙන් තිබුණු ඒ වහල් බැමි බිඳ ගෙන, අද මේ රටේ උගතුන්, වියතුන් බවට පත් වෙලා ඉන්නේ.

ගරු සභාපතිතුමනි, ද්විතියික පාසල් සංකල්පය පසුගිය රජය ඉදිරිපත් කළත්, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ අධ්‍යාපන ක්‍රමවේදය තුළ නිර්මාණය වුණු බව අපි කවුරුත් අවිවාදාත්මකව පිළිගන්නා කාරණාවක්. ගරු සභාපතිතුමනි, අධ්‍යාපනයේ සමාන අවස්ථා සමස්ත ජාතියේ දරුවන්ට හිමි විය යුතුයි කියන සංකල්පය තුළ අපි කවුරුත් මේ පිළිබඳව දරන මතය තුළ කොළඹ ආනන්ද විද්‍යාලයේ, නාලාන්දා විද්‍යාලයේ, රාජකීය විද්‍යාලයේ, තර්ස්ටන්, ඉසිපතන, සිරිමාවෝ බණ්ඩාරනායක, ඩී.එස්. සේනානායක, විසාකා, අනුලාදේවී වාගේ මේ දැවැන්ත පාසල් පද්ධතිය තුළ දරුවෙකුට හිමි වන අධ්‍යාපනයේ වරප්‍රසාද ග්‍රාමීය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළත් දරුවන්ට හිමි විය යුතුයි කියන සංකල්පය තුළ තමයි එදා මධ්‍ය මහා විද්‍යාල ක්‍රමය නිර්මාණය වුණේ. ඒ තුළ ද්විතියික පාසල් අධ්‍යාපනය කලක් යන කොට - උදාහරණයකට ගත්තොත් වාද්දූව මධ්‍ය මහා විද්‍යාලය වාගේ මධ්‍ය මහා විද්‍යාලවලට ප්‍රාථමික පන්ති ආරම්භ කරන්න පටන් ගත්තා. 1990 දශකයේ. මෙය හුදෙක් කළේ දේශපාලනික වශයෙන් දේශපාලඥයන්ගේ මනාපය උදෙසා කළ ක්‍රියාවලියක් මිස, අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලියකට තුඩු දෙන තීන්දුවක්, තීරණයක් නොවෙයි. නමුත් ද්විතියික පාසල් සංකල්පය නිර්මාණය වුණාට පස්සේ අපේ ගම්වල තිබෙන පුංචි පුංචි කනිෂ්ට පාසල්වල දරුවන්ටත් යහපත් අනාගතයක් මේ තුළින් නිර්මාණය වේවි කියන මහා දැවැන්ත බලාපොරොත්තුව තුළ අපි අතිශයින්ම සන්තෝෂයට පත් වුණා.

ගරු සභාපතිතුමනි, ඉතාමත් කනගාටුදායක සිද්ධියක්. ඊයේ මම දැක්කා රූපවාහිනියේ. අපේ මේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු ඉස්සරහායින් ඉන්නවා යෝධයෙක් වාගේ. පිටිපස්සෙන් අම්මලා තාත්තලා ටිකක් ඉඳගෙන කෑ ගහනවා. කල්පිටිය කනිෂ්ට විද්‍යාලය, වාද්දූව ධර්මපාල විද්‍යාලයේ ද්විතියික පාසලක් කරලා. එහි මහින්දෝදය තාක්ෂණාගාරය ඉදි කළාට පස්සේ මේකට සම්බන්ධ වූ පෝෂිත පාසල් පද්ධතිය. තල්පිටිය කනිෂ්ට විද්‍යාලය, මහා වාද්දූව කනිෂ්ට විද්‍යාලය. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අනික් කනිෂ්ට විද්‍යාලය වේරගම කනිෂ්ට විද්‍යාලය. ගරු සභාපතිතුමනි, මහා වාද්දූව කනිෂ්ට විද්‍යාලයේ 2012 ප්‍රතිඵල බැලුවොත් අ.පො.ස. (සා.පෙළ) 0% යි. 2013 0% යි. මඩවිල්ගොඩ කනිෂ්ට විද්‍යාලය අපි මේකට යා කරන්න යෝජනා කළා. 2012 දී අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල 67% යි. 2013 දී 36% යි. ගරු සභාපතිතුමනි, වාද්දූව වේරගම කනිෂ්ට විද්‍යාලයේ ප්‍රතිඵල බැලුවොත් 2012 වර්ෂයේ 33% යි. 2013 වන කොට 27% ට අඩු වෙනවා. මේ ආදී වශයෙන් බැලුවොත් එහෙම 29% න් 2% න් 6%, 14% වශයෙන් මේ වර්ෂයක් ඇතුළත ප්‍රතිඵල විශ්ලේෂණ වාර්තා අනුව ප්‍රතිඵල පහළ බහිනවා. මේ පුංචි පුංචි පාසල් පද්ධතිය එකතු කරලා මහා අසීමිත භෞතික සම්පත් කන්දරාවක්, තමන්ට අවශ්‍ය කරන විද්‍යාගාර පහසුකම්, මහා දැවැන්ත ක්‍රීඩා භූමියක්.

ඒ වාගේම අවශ්‍ය කරන සම්මන්ත්‍රණ ශාලා, මේ ආදී විශාල සම්පත් රාශියකින් ඒකරාශී වුණු ධර්මපාල විද්‍යාලයට ප්‍රාථමික අධ්‍යාපනය ලබන්න, මේ ප්‍රාථමික පාසල්වල දරුවන්ට ඉඩ පහසුකම් සලස්වලා ද්විතියික පාසල සංවර්ධනය කරන්න යන කොට අද අවුරුදු දෙකකට පස්සේ මේ ක්‍රියාවලිය ආරම්භ කරලා 6, 7 පන්ති දෙකක් ධර්මපාල විද්‍යාලට ඒකාබද්ධ කළාට පස්සේ මේ මැතිවරණ ප්‍රතිඵලය කිව්වාවට පස්සේ, දැන් අලුතෙන් දේශපාලඥයෝ ඉදිරිපත් වෙලා මේ වැඩ පිළිවෙළ අවුල් කරන්න, තමන්ගේ හිතවත් පාක්ෂිකයෝ ටිකක් එළියට බස්වනවා. ඊයේත් කරපු පිකටින් එකේ ගරු සභාපතිතුමනි, නායකත්වය ගත්තේ තාත්තා කෙනෙකුයි දුවෙකුයි. ඒ තාත්තයි දුවයි කිසිම විධියකින් මේ ඉස්කෝලයට සම්බන්ධයක් නැහැ. ඔවුන් පැහැදිලිව මේ ප්‍රදේශයේ දේශපාලඥයාගේ තැරැව්කරුවන් හැටියට තමයි මේ විරෝධතාවය ක්‍රියාත්මක කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An Hon. Member

කවුද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

තමුන්නාන්සේලාගේ කෙනෙක්. මම පෞද්ගලිකව නම කියන්නම්. මගෙත් ආදරණීය මිත්‍රයා. දේශපාලන වශයෙන් එපමණ පොහොසත් වෙලා නැහැ. ගරු සභාපතිතුමනි, මේ දුප්පත් අහිංසක දරුවන්ගේ අධ්‍යාපනයේ සමාන අවස්ථා ලබා දීමට, කොළඹ රාජකීය විද්‍යාලයේ ඉගෙන ගෙන අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රශ්න පත්‍රයම තමයි අපේ තල්පිටිය කනිෂ්ට විද්‍යාලයේ දරුවාටත් මුහුණ දෙන්න තිබෙන ප්‍රශ්න පත්‍රය. ගරු සභාපතිතුමනි, නිකම්වත් තල්පිටිය කනිෂ්ට විද්‍යාලයේ දරුවෙකුට රෝයල් එකේ Swimming phool එකට බහින්නවත් ඉඩක් දෙනවාද? බහින්නවත් ඉඩක් දෙන්නේ නැහැ. අසළ ඉඳගෙන බලන්නවත් ඉඩ දෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, අධ්‍යාපනයේ සමාන අවස්ථා පිළිබඳව මහා පුරාජේරු දෙඩුවාට. ඉතින් එවැනි අසාධාරණකම් පිරුණු සමාජයක් තුළ මෙවැනි දේ ක්‍රියාත්මක වීමේදී මේවාට අකුල් හෙලනවා නම්, මේ තුළ ඇති වන මහා අසාධාරණය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An Hon. Member

කවුද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

තමුන්නාන්සේලාගේ විජිත් ප්‍රියන්ත මැතිතුමා. කියන්න කියපු නිසයි මම කිව්වේ. නැත්නම් මම කියන්න ඕනෑ නැහැ. මේ වාගේ පහත් ක්‍රියාවලියක යෙදීම අතිශයින් අවාසනාවන්ත තත්ත්වයක් ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, දේශපාලනය පෞද්ගලිකව දේශපාලනයක් කරන්නවුන් උදෙසාද? ඔවුන්ගේ යහපැවැත්ම සඳහාද? ඔවුන්ගේ පෝෂණය සඳහාද? ඔවුන්ගේ උදර පෝෂණය සඳහාද? මේ කිසිවක් සඳහා නොවෙයි ගරු සභාපතිතුමනි. දේශපාලනය හුදෙක් රටක දුක් විඳින අහිංසක ජනතාවගේ සුබ විහරණය, අනාගත යහපත වෙනුවෙන් කරන ක්‍රියාවක් නම් මේ ආකාරයෙන් සිදු විය හැක්කේ නැහැ.

ගරු සභාපතිතුමනි, මෙවැනි අයුතු අසාධාරණකම් ගරු මෛත්‍රීපාල සිරිසෙන අතිගරු ජනාධිපතිතුමාගේ යහපාලනය තුළ සිදු වීම අපට අතිශය කනගාටුදායක මානසික තත්ත්වයක්. ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය නිවැරදි වෙන්න ඕනෑ. අපි ඉතාමත් යහපත් ලෙස දින 100 වැඩ පිළිවෙළට පාර්ලිමේන්තුවේ බහුතරයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු උදව් කරද්දී මේ පළාත් සභාව කට ඇරලා, අතිගරු ජනාධිපතිතුමාගේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයේ දින 100 වැඩ පිළිවෙළ කරනවාය කියලා සනාථ කරද්දී, මෙවැනි පහත් ක්‍රියාවන් ප්‍රාදේශීය මට්ටමට ගිහිල්ලා මේ රටේ ජනතාවගේ අහිංසක දුක් විඳින දෙමව්පියන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබන්න තිබෙන අවස්ථාවටත් අතුල් පහර ගහනවා නම්, කොහොමද අපි අනාගත බලාපොරොත්තු සඵල කර ගන්නේ. ගරු සභාපතිතුමනි, කථා කරනවා නම් කථා කරන්නේ, බොහෝ කරුණු කාරණා සහිතව. මේ පොත පතේ තිබෙනවා. මේ වාද්දුව තල්පිටිය කනිෂ්ට විද්‍යාලයේ විදුහල්පතිතුමිය කනිෂ්ට පාසලක් හැටියට මේ පාසල සංවර්ධනය කරන්න මට යෝජනා කරපු යෝජනාවලිය. ඒ විදුහල්පතිතුමිය අද අසරණ වෙලා ඉන්නවා. මේ කටයුත්ත කර ගන්න විධියක් නැහැ. දේශපාලඥයෝ මැදිහත් වෙලා. අද පාසලේ දෙමව්පියෝ 50 ක් 60 ක් එළියට අරගෙන. 400 ක් දරුවෝ ඉන්න පාසලේ. අද මේ අයුක්තිය අසාධාරණය කරනවා. ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව - (බාධා කිරීම්)

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඕවා අහන්න කෙනෙක් නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මහ ඇමතිතුමා ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග ගනියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, මේවා අහන්න ඉදිරි පෙළේ කවුරුවත් නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මෙවැනි සිදුවීම් පිළිබඳව ජාතියට හෙළිදරව් කිරීම අපේ වගකීමක් හැටියට සලකනවා. ඒ නිසා ගරු සභාපතිතුමා හරහා මම ගරු විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලීමක්

කරනවා, ඔබතුමාගේ මන්ත්‍රීවරුන්ව විනය පිහිටුවලා ජනතාවාදී මන්ත්‍රීවරුන් බවට පත් කරන්න කියලා. එසේ ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS' MOTION:

## අසාධාරණයට පත් නීති සිසුන්ට සාධාරණයක් ඉටු කරමින් නීති විද්‍යාලයේ අර්බුදය විසඳන මෙන් මධ්‍යම රජයට යෝජනා කිරීම
TO PROPOSE THE CENTRAL GOVERNMNET TO SOLVE THE CRISIS IN LAW COLLEGE TO METE OUT JUSTICE TO LAW STUDENTS WHO FACE INJUSTICE

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"නීති විද්‍යාලය මේ වන විට නීතියේ පාලනයෙන් තොරව අත්තනෝමතිකව තීන්දු ගන්නා ආයතනයක් බවට පත් වී ඇත. මෙම ක්ෂේත්‍රයේ ඉහළම වගකීම් දරන පුද්ගලයන් නීති ශිෂ්‍යයන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කරන තත්ත්වයට පත්ව ඇත. ඒ සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ට පැමිණිලි කරන්නට ආයතනයක් නැත. අධිකරණයට ද යා නොහැක.*

*මෙවැනි තත්ත්වයක් තුළ සියවසක් සපිරෙන නීති විද්‍යාලයේ අභිමානය ආරක්ෂා කර අනාගත පරපුරට පැවරීමේ වගකීම මේ රජයේ යුතුකමකි. එම නිසා දැඩි අසාධාරණයට ලක්ව සිටින නීති විද්‍යාලයේ සිසුන්ට සාධාරණයක් ඉටු කරමින් ගරා වැටුණ නීති විද්‍යාලය සම්බන්ධයෙන් පවත්නා අර්බුද කඩිනමින් විසඳිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි."*

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[අ.භා. 12.04]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අපි හැමෝම දන්නවා. කන්‍යාවියක් ඉන්නවා. ඇස් දෙක බැඳලා තිබෙනවා. තරාදියක් අතට අරන් ඉන්නවා. අපි අහලා තිබෙන විදියට ඒ ඇස් දෙක බැදලා තිබෙන්නේ, එතරම් නීතිය සාධාරණයි කියලයි. තරාදියක් අතට දීලා තිබෙන්නේ, නීතිය එතරම් සමබරයි කියන්න. කන්‍යාවියක් දාලා තිබෙන්නේ නීතිය එතරම් පිරිසිදුයි කියලයි. නමුත් පසුගිය කාලයේ මේ නීතියේ කන්‍යාවියගේ කන්‍යාභාවය බොහෝ ස්ථානවලදී විනාශ වුණා. එම නිසා ගරු සභාපතිතුමනි, ඒ විනාශ වුණු තවත් ස්ථානයක් විදියට මේ රටේ නීති විද්‍යාලය අපට හඳුන්වන්න පුළුවන්කම තිබෙනවා. අපේ ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා මේ නිදහස් අධ්‍යාපනයේ බේදවාචකයක් ගැන කථා කළා. ගරු සභාපතිතුමනි, මේ රටේ නීති විද්‍යාලයට ඇතුළත් වෙන්න 20,000 ක් 30,000 ක් පමණ සිසුන් සිංහල මාධ්‍යයෙන්, ද්‍රවිඩ මාධ්‍යයෙන් සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් විභාගයට ලියනවා. සිංහල මාධ්‍යයෙන් සහ ද්‍රවිඩ මාධ්‍යයෙන් විසි, තිස් දාහක් විභාගය ලියලා තේරෙන අතලොස්සක් සිසුන්ට සිංහල භාෂාවෙන් නීති විද්‍යාලයේ ඉගෙන ගෙන යන කොට එක පාරටම ගරු සභාපතිතුමනි, ඔවුන්ට කියනවා, සිංහලෙන් ඉගෙන ගත්තාට දැන් කරන්න දෙයක් නැහැ. ප්‍රශ්න පත්‍රය දෙන්නේ ඉංග්‍රීසියෙන්. ඉංග්‍රීසියෙන් දෙන ප්‍රශ්න පත්‍රය කියවලා සිංහලෙන් උත්තර ලියන්න ඕනෑ කියලා. ද්‍රවිඩ ළමයින්ට කියනවා, ද්‍රවිඩ භාෂාවෙන් නීති විද්‍යාලයට ඇතුළත් වෙලා ඉන්න සිසුන්ට කියනවා. ඔබ ද්‍රවිඩ වුණාට කරන්න දෙයක් නැහැ. ඔබ ඉංග්‍රීසි නොදන්නවා වුණාට කරන්න දෙයක් නැහැ. ප්‍රශ්න පත්‍රය දෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඉංග්‍රීසියෙන් කියවලා දෙමළෙන් උත්තර ලියන්න කියලා.

ගරු සභපතිතුමනි, වාසුදේව නානායක්කාර මහත්මයා හිටපු ආණ්ඩුවේ මේ භාෂා පිළිබඳ ඇමතිවරයා. එතුමා ඔලුවේ අත තියා ගත්තාලු දවසක් මේක දැකලා. හැබැයි, එතුමාට කරන්න දෙයක් තිබුණේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ නීති විද්‍යාලය බරපතළ ලෙස කඩාගෙන වැටුණා. හැබැයි, ඒවා ගැන කියන්න ළමයින්ට පැමිණිලි කරන්න ස්ථානයක් තිබුණේ නැහැ. ඇයි? Legal Council එක, එහෙම නැත්නම් නීති සනාථන සභාවේ ප්‍රධානීන් කවුද? අග්‍රවිනිශ්චයකාරවයා. නීතිපති.

[ගරු නිරෝෂන් පාදුක්ක]

ඒ වාගේම නීතිඥ සංගමයේ සභාපති. පසුගිය කාලයේ තමන්ට වුණු අසාධාරණයක් කියන්න තුෂාර ජයරත්න කියන ශිෂ්‍යයා ගියා -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දැන් ඉන්නේ ස්විස්ටර්ලන්තයේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ස්විස්ටර්ලන්තයේ දැන් ඉන්නේ. මානව හිමිකම් කවුන්සිලේට ගියා. ගිහිල්ලා තමන්ගේ පැමිණිල්ල කළා. ගරු සභාපතිතුමනි, සිද්ධ වුණේ මොකක්ද? ඔහු මුහුණ දීපු විෂයයන් සියල්ලෙන්ම ඔහුව අසමත් කෙරෙව්වා. අසමත් කරවලා අද ඔහුගේ ජීවිතයේ අනාරක්ෂිත තත්ත්වය නිසා ඔහුට අද මම හිතන විධියට මුලින්ම එංගලන්තයට ගියා. දැන් ඉන්නේ ස්විස්ටර්ලන්තයේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මරණ භයට ගියේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මරණ භයට. ගරු සභාපතිතුමනි, ඒක තමයි නීති ශිෂ්‍යයෙක් වීමේ වරද. පසුගිය කාලයේ සිද්ධ වුණේ. ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. නීති විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේදී ක්‍රමවේද කිහිපයක් තිබුණා. ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ මේ ප්‍රශ්න පත්‍රය හැදුවේ කවුද? ප්‍රශ්න පත්‍රය හදන්න භාර දුන්නා කොළඹ විශ්ව විද්‍යාලයේ නීති අංශයේ අයට. කාලයක් භාර දුන්නා විවෘත විශ්ව විද්‍යාලයේ කණ්ඩායමකට. කොහොමද හදන්නේ ප්‍රශ්න පත්‍ර. හදනවා විතරක් නොවෙයි. සිවිල් නීතිය දෙවැනි ප්‍රශ්න පත්‍රයේ දෙන්න ඕනෑ ප්‍රශ්න අංක 01 ප්‍රශ්න පත්‍රයට දැම්මා. අංක 01 ප්‍රශ්න පත්‍රයට ඕනෑ ඒවා ප්‍රශ්න පත්‍ර අංක 02 ට දැම්මා. සමහර විෂයන් ඒ විෂයට අදාළ නැති ප්‍රශ්න අහන්න පටන් ගත්තා. ඒ වාගේ විවිධ ආකාරයේ පැමිණිලි තිබුණත්, සිසුන්ට පැමිණිල්ලක් කරන්න පුළුවන් ස්ථානයක් නීති විද්‍යාලය තුළ තිබුණේ නැහැ. ඒ සඳහා ඉඩක් තිබුණේ නැහැ. ඒ නිසා සිසුන් විශාල වශයෙන් ප්‍රශ්න රාශියකට මුහුණ දුන්නා. මෙතුමා කියනවා වාගේ නිදහස් අධ්‍යාපනය කියලා සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා එදා කිව්වේ, නොමිලයේ උගන්වන එකයි. නොමිලයේ උගන්වනවා කියලා තමයි එදා සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපනය ගෙනාවේ. අපි 56 දී ඒකට අලුත් අර්ථකථනයක් දුන්නා. නිදහස් අධ්‍යාපනය යනු සිංහලෙන් ඉගැන්වීමයි කියලා. අපි ඒ 56 දී දීලා දැන් අවුරුදු 60 ක් ගියාට පස්සේ ඒක දැන් අනික් පැත්ත හැරිලා ගරු සභාපතිතුමනි. දැන් කියනවා, සිංහලෙන් ඉගෙන ගෙන වැඩක් නැහැ. සිංහල ඉගෙන ගත්තාට මදී. ඉංග්‍රීසියෙන් කියවලා උත්තර ලියන්න බැරි නම් විභාගය පාස් කරන්න බැහැයි කියලා. හැබැයි, මේ වන කොට රටේ විදේශ විශ්ව විද්‍යාල, විදේශ පාසල් රාශියක් පිහිටුවලා තිබෙනවා. හැබැයි, අද කන්නන්ගර ප්‍රතිපත්තිය අමු අමුවේ විශ්ව විද්‍යාල පද්ධතිය තුළත් විනාශ වෙමින් තිබෙනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාට කියන්නේ, පසුගිය කාලයේ විතරක් නොවෙයි. ලංකාවේ බැලුවොත් අඩියෙන් අඩිය ගොඩනැගිලි හැදෙනවා. කියන්න කනගාටුයි. මේ නීති විද්‍යාලය ඇතුළේ යටිතල පහසුකම් නැහැ. සිසුන් විභාගය දවසේ හදිසි අවශ්‍යතාවයකට වැසිකිළි යන්න ගියාම වැසිකිළි දෙකයි තිබෙන්නේ. ප්‍රශ්න පත්‍රය පටන් අරන්. ළමයි වැසිකිළියේ පෝලිමේ. මේ ශ්‍රී ලංකාවේ නීති විද්‍යාලයේ තත්ත්වය. කැන්ටින් එකක් නැහැ. මේවා ගැන ළමයෙක් පැමිණිලි කළොත් එහෙම ඔහුට සිද්ධ වෙනවා විභාගය අසමත් වෙන්න. සමහරුන්ව AC කාමරවල දාලා, තනියෙන් ප්‍රශ්න පත්‍රය දීලා වහලා ලොක් කළා. ලොක් එක කඩාගෙන හොරෙන් එළියට ගියා. හැබැයි, විෂයයට ලකුණු අනුගණන් අරන් සම්මානත් දුන්නා මේ අය.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

99 යි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ලකුණු 99 ක් දුන්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලැප්ටොප් දීලා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ නිසා එහෙව් නීති විද්‍යාලයක් තමයි පසුගිය කාලයේ මේ රටේ තිබුණේ ගරු සභාපතිතුමනි. ඒ නිසා විශේෂයෙන් තවත් කාරණයක් තමයි මේ දෙන අංකය. විභාග අංකය. විභාග අංකයෙන් පුළුවන් ප්‍රශ්න පත්‍රය බලන පුද්ගලයාට ඔහු කොහෙන්ද ආවේ කියලා සොයා ගන්න. විභාගයේ අංකය අනුව ඔහුට කියනවා, ඔහු ලන්ඩන් නීති විශ්ව විද්‍යාලයෙන් ඇවිල්ලා ශ්‍රී ලංකාවේ ෆයිනල් කරන්න ආපු කෙනෙක්ද? විවෘත විශ්ව විද්‍යාලයෙන් ද ආවේ. පසුගිය කාලයේ මේ කිසිදු රහස්‍යභාවයක් නීති විද්‍යාලයේ ප්‍රශ්න පත්‍ර ලකුණු කිරීමේදී කෙරිලා නැහැ.

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව දැම්මේ මම පසුගිය රජය තිබෙද්දී. යෝජනාව සභාවට එන්නේ අලුත් ආණ්ඩුවක් තිබෙද්දී. ගරු සභාපතිතුමනි, ඒ නිසා අපි විජයදාස රාජපක්ෂ අධිකරණ ඇමතිවරයාට මේ සම්බන්ධව කියලා තිබෙනවා. එතුමා මේ සම්බන්ධයෙන් කෙටුම්පත් හදනවාය කියලා අපි දන්නවා. නමුත් බස්නාහිර පළාත විධියට, මේ රටේ නීති විභාගයට වැඩියෙන්ම මුහුණ දෙන සිසුන් ඉන්න පළාත හැටියට බස්නාහිර පළාත් සභාවේ යුතුකමක් තිබෙනවා, එහි යෝජනාවක් සම්මත කරලා අලුත් අධිකරණ අමාත්‍යවරයාට ඉදිරිපත් කරන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපේ මේ යෝජනාව සමස්ත බස්නාහිර පළාතේ සිසුන් වෙනුවෙන්, නීතිඥවරුන් වෙන්න හිතා ගෙන ඉන්න අපේ අහිංසක දරුවන්ගේ අනාගතය වෙනුවෙන්. මේ යෝජනාව මම මේ සභාවට ඉදිරිපත් කරලා ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව අපි උත්සාහ කරමු අලුතෙන් යමක් මේ රටේ නීති විද්‍යාලය සම්බන්ධයෙන් ගොඩනගන්න බස්නාහිර පළාත් සභාවේ මතයත් - හැමදාම, බස්නාහිර පළාත් සභාවට අනවශ්‍ය යෝජනාත් එන අස්සේ මේ වාගේ යෝජනාවකින් අපේ රටේ මධ්‍යම ආණ්ඩුවටත් බලපෑමක් කරන්න පුළුවන්ද කියන එක අපි බලමු. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.12]

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරනවා. ඒ නිසා මට හිතෙනවා මගේ කථාව පටන් ගන්න විජයදාස ලියනආරච්චි නීතිඥ මහත්තයාට වුණු දේ ගැන කියලා. මේ රටේ 88/89 දී තරුණ සංහාරයක් යෙදෙන වෙලාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ ඉගෙන ගත්ත ශිෂ්‍යයෙක් විධියට අපේ තරුණයෝ 18 දෙනෙක්, නීති පීඨයේ තරුණයෝ 18 දෙනෙක් මරා දමද්දී මානව හිමිකම් කවුන්සිලයට, මානව හිමිකම් පෙත්සම්, ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කරපු විජයදාස ලියනආරච්චිව මරා දැම්මේ බටලන්ද වධකාගාරයේ ඇසිඩ් භාජනයක ගිල්ලවලා. අද රනිල් වික්‍රමසිංහගේ අගමැතිකමේ නායකත්වය යටතේ (බාධා කිරීම්) කියන කොට කට වහගෙන ඉන්න. ලැජ්ජා නැතිකම. තමුන්නාන්සේලාට ලැජ්ජා නැතිව ඇති. අපට ඉතිහාසය මතකයි. ගෝනි බිල්ලන්ට ඕවා මතක නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අනුර කුමාර දිසානායක ගරු මන්ත්‍රීතුමාට විධායක සභාවේ අරලිය ගහ මන්දිරයේ කාමරයක් තිබෙනවා. ඔයිට වැඩිය හොඳයි බටලන්ද වධකාගාරයේ කාමරයක ඉඳගත්තා නම්. යූ.එන්.පී. යත් එක්ක දීග කන එක. ඒ නිසා ඉතිහාසයේ දේවල් මම කථා කරන්න යන්නේ නැහැ. ඊට වඩා මම කථා කරන්න යන්නේ නැහැ ගරු සභාපතිතුමනි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කාමරේ කොහේද තිබෙන්නේ.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

හැබැයි, අද ඒ ගෝනිබිල්ලෝ ටික විතරක් ඉතිරි වෙලා. මේ රටේ තරුණයින්ට වුණු අසාධාරණකම් පිළිබඳව. බටලන්ද වධකාගාරයේ මේ රටේ නීති පීඨයේ ශිෂ්‍යයින්ට, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට කරපු අපරාධය ගැන.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දිනේෂ්ගේ කාමරය මැදමුලන.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

අද මේ රටේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට කරපු අපරාධය ගැන තමන්ගේ හෘද සාක්ෂිය එළියට දාලා, යූ.එන්.පී. එකත් එක්ක දීග කන එක පැත්තකට දාන්නය කියලා අපි ඉල්ලීමක් කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඕගොල්ලෝ එක්ක දීග කෑවේ. ගිය ආණ්ඩුවේ.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

තමුන්නාන්සේ කිව්වා. ජීනීවාවල නොවෙයි අද ඉන්නේ. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. ගරු සංවිධායකතුමා, මූලාසනයට කථා කරන්න.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

අද පොළොව යට ඒ තරුණයෝ සැතපිලා ඉන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව හරහා නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඉස්මතු කරන්න ගියේ මීට වඩා වැදගත්, බරපතළ තර්කයක්. මම දන්නේ නැහැ. මට හිතෙන දේ. හැබැයි, එතුමා අද ඒ යෝජනාව ඉදිරිපත් කළේ නැහැ. මේ කරුණු දැක්වීමේ ඒ කරුණ අන්තර්ගත වුණේ නැහැ. ඔබතුමන්ලාත් දන්නවා. මමත් දන්නවා. පසුගිය කාල වකවානුව තුළ අසීමාන්තික ලෙස නීති විද්‍යාලයට තෝරා ගනු ලැබුවේ ද්‍රවිඩ මාධ්‍ය සිසුන්. තරග විභාගයක් පැවැත්වුවාට - මම මේ ජාතිවාදය ගැන නොවෙයි කියන්නේ. එතුමාගේ හෘදය සාක්ෂිය තුළ ඇති. අපි කොළඹ මහජන පුස්තකාලයේ තිබුණු සම්මන්ත්‍රණයට සහභාගී වුණා. බරපතළ ලෙස - රාවුෆ් හකීම් ඇමතිතුමා අධිකරණ අමාත්‍යවරයා ලෙස කටයුතු කරමින් සිටි වකවානුව තුළ සිංහල මාධ්‍යයෙන් නීති විද්‍යාල ප්‍රවේශ පත්‍රයට - කොළේ හංගලා ගහන්න ඕනෑ නැහැ. නීති විද්‍යාලයට සිංහල මාධ්‍යයෙන් ලියපු සිසුන්ට බරපතළ අසාධාරණයක් සිදු වුණා. ඒක කියන්න -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ඒ වෙලාවේ කොහේද දන්නේ නැහැ හිටියේ. කැබිනට් එකේ ඇමති දිනේෂ්ට කථා කරන්න තිබුණා නේ? මොනවාද කළේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

කථා කළේ නැත්තේ ඇයි?

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඔව්. හිටපු ජනාධිපතිතුමාට වැරදුනේ ඒක තමයි. හිටපු ජනාධිපතිතුමාට වැරදුනේ ඒක. අපි එදත් ඒ රැස්වීමට ගියා. නීති විද්‍යාල සිසුන්ට - (බාධා කිරීම්) මේ මාතෘකාව හරහා එතුමා කියන්න උත්සාහ කරන්න පටන් ගත්තේ ඒකයි. එතුමා ඒක කිව්වේ නැත්නම් මට ඒක කියන්න පුළුවන්කම තිබෙනවා. මම ඒක කියනවා. දේශපාලනය නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොහොමත් රාජපක්ෂලා ගැන කියන කොට මහජන එක්සත් පෙරමුණට රිදෙනවා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

වැරදි තිබෙනවා. අඩුපාඩු තිබෙනවා. නමුත් අයුතු ලෙස -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි නාමල් ලොක්කා හරහා වුණු අසාධාරණය?

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ද්‍රවිඩ මාධ්‍යයෙන් නීති විද්‍යාලයට විභාගය සමත් වුණු සිසුන් -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සංවිධායකතුමා, මම කියන්න උත්සාහ කළේ ඒක නොවෙයි. දැන් ඔබතුමා සිංහලෙන් නේ උපාධිය ගත්තේ. ඉංග්‍රීසියෙන් ප්‍රශ්න පත්‍රය දුන්නොත් පුළුවන්ද ලියන්න.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

මට බැහැ ලියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා කථා කර ගෙන යන්න.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඒ නිසා මම විශේෂයෙන්ම මේ කරුණ පිළිබඳව මතක් කරනවා. ද්‍රවිඩ මාධ්‍ය සිසුන් නීති විද්‍යාලයට බඳවා ගත් ආකාරය පිළිබඳව නැවත සමීක්ෂණයක් කරන්නය කියන ඉල්ලීම මේ වෙලාවේ මම මේ සභාවෙන් ඉතාමත් ඕනෑකමින් ඉල්ලනවා. නැවත පරීක්ෂණයක් ඉල්ලනවා. (බාධා කිරීම්) පසුගිය අවුරුදු පහ තුළ වූ - (බාධා කිරීම්) නැවත පරීක්ෂණයක් කරන්න. සියලුම දෙනා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

නාමල් රාජපක්ෂ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ප්‍රශ්න පත්‍රය අපට දෙනවාද බලන්න.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඔහු ඇතුළු ඕනෑම කෙනෙක් ගැන නැවත පරීක්ෂණයක් කරන්න. සුදුසුකම් නැත්නම් ඒ අය ඉවත් කරන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, කොළේ වහලා ගහන්න ලැහැස්ති වෙන්න එපා. ඇත්ත කියන්න භය වෙන්න එපා. නීති විද්‍යාලයේ විභාගය ලියපු තරුණයෝ 20,000 කට වඩා සිංහල මාධ්‍යයෙන් ලියපු තරුණයන්ට බරපතළ අසාධාරණයක් සිද්ධ කළා. බරපතළ අසාධාරණයක් සිද්ධ කළා. ඒ නිසා නීතියේ ස්වාධිපත්‍ය සහ නීතියේ ආධිපත්‍ය ගැන කථා කරන්න දෙයක් නැහැ. අපි දන්නවා. අලුත් ආණ්ඩුව පත් වුණේ, යහපාලන ආණ්ඩුව පත් වුණේ, ඒ නීති ක්ෂේත්‍රයේ සාධාරණය ඉෂ්ට කරනවා කියන පොරොන්දුව මත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අග්‍රවිනිශ්චයකාරයෙක් පත් කිරීම පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපි අහනවා. ශිරාණි බණ්ඩාරනායක මැතිනිය අස් කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන ක්‍රමවේදයක් තිබෙනවා. මේ අග්‍රවිනිශ්චයකාරවරිය ගැන එතුමා මතු කළා. මේ නීති කවුන්සිලයේ ප්‍රධානියා අග්‍රවිනිශ්චයකාරයා. ඒ නිසයි මම මේ කියන්නේ. දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මත පාර්ලිමේන්තුව තුළ යෝජනා සම්මතයකින් තමයි ශිරාණි බණ්ඩාරනායක මැතිනියව ඉවත් කළේ. ඒක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, - (බාධා කිරීම්) ඇත්ත කථා කරන්න. ඇත්ත.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වන්න. ඔබතුමාට කථා කරන්න අවස්ථාව දෙන්නම්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභාව නොමග යවන්න දෙන්න බැහැ.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මත තමයි ශ්‍රේෂ්ඨාධිකරණය අග්‍රවිනිශ්චයකාරවරයා ඉවත් කළ යුත්තේ. මොහාන් පීරිස් මැතිතුමාව ඉවත් කළේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින්ද කියලා මම අහනවා. (බාධා කිරීම්) මම අහන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුගමනය කළාද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුගමනය කරලා නැහැ. එසේ නම් ඔය කියන නීතියේ අධිපත්‍ය -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ශිරාණි බණ්ඩාරනායකව අයින් කළේ කොහොමද? ඒක කියන්න.

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

නීතියේ ආධිපත්‍ය කියන්නේ විහිළුවක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දෙවියෝත් කෝප වුණා.

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඔව්. තව කෝප වෙනවා. හෙට අනිද්දා තව කෝප වෙනවා. රටට වුණු දේට හෙට අනිද්දාට දෙවියෝ තව කෝප වෙනවා. මේ නීතියේ ආධිපත්‍ය කියන්න යනවා. ලැජ්ජා නැති කතන්දර. ඒ නිසා අඩුපාඩු වැරදි තිබෙනවා. අපි හිටපු ආණ්ඩුවේ වැරදි අඩුපාඩු තිබෙනවා. එදත් අපි කොන්ද කෙළින් තියාගෙන කිව්වා. ඒවා නිවැරදි කරන්න. යූ.එන්.පී. යට ජැක් ගහන්න දේශපාලනය කරන්න එපාය කියලා මම ජනතා විමුක්ති පෙරමුණට ආරාධනා කරනවා. ඉතාම ආදරයෙන්. මම ඒ සහෝදරවරුන්ට කියනවා. ඒ නිසා තව කරුණු තුනක් ඉදිරිපත් කරනවා. ඒ නිසා ඉතිහාසය තුළ (බාධා කිරීම්) තමුන්නාන්සේලා බුරන එක ගැන මම පුදුම වෙන්නේ නැහැ. අසාධාරණ ලෙස තමුන්නාන්සේලා නීති විද්‍යාලයට ශිෂ්‍යයෝ ගත්තේ. ඒ නිසා සාධාරණ පරීක්ෂණයක් කරලා පසුගිය වකවානුව තුළ නීති විද්‍යාලයට ශිෂ්‍යයන් ගැනීම පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියන ඉල්ලීම කරමින්, ඔබතුමන්ලාගේ යෝජනාවට අපේ ආදරය, ප්‍රශංසාව පුද කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.20]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ නීති විද්‍යාලයේ ගැටළුවට අදාළව සාකච්ඡා කරද්දී, මේ නීති විද්‍යාලයේ පෞරුෂය පල්ලෙහාට ඇදලා දැම්මා නම්, නීති විද්‍යාලයේ තිබුණු පෞරුෂය පල්ලෙහාට ඇදලා දැම්මා නම්, ඒ පල්ලෙහාට ඇදලා දැමීමට අදාළව වගකිවයුතු ප්‍රධාන පුද්ගලයෝ දෙන්නෙක් ඉන්නවා. මේ පුද්ගලයෝ දෙන්නා තමයි තාත්තා කෙනෙකුයි පුතෙකුයි. එක්තරා තාත්තා කෙනෙක් ඉන්නවා. තව පුතෙක් ඉන්නවා. මේ දෙන්නාම නීතිඥවරු. මේ දෙන්නා තමයි වැඩිම ප්‍රමාණයක් මේ නීති විද්‍යාලයේ පෞරුෂය බිඳපු දෙන්නා. ඒ තාත්තා නීතිඥ මහත්මයෙක් වුණේ විභාගය ලියලා නොවෙයි. තාත්තා නීතිඥවරයෙක් වුණේ මන්ත්‍රීවරයෙක් වෙලා පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා ගිහිල්ලා තමයි නීතිඥ මහත්තයා වුණේ. එතකොට විභාග ප්‍රශ්න පත්‍ර ලිව්වේ වෙන කෙනෙක්. එතකොට පුතෙක් ඉන්නවා. ඒ පුතා පළමු වතාවට නීති විද්‍යාලයට එද්දී නීති විද්‍යාලයේ විදුහල්පති බුලත් දුම්කොළ දීලා පිළිඅරගෙන, වෙනම AC කාමරයකට අරන් ගිහිල්ලා, ලොක් කරලා එහෙම තමයි ප්‍රශ්න පත්‍රය ඇතුළේ තියලා පුතාට විභාගය ලියන්න සැලැස්සුවේ. අන්න ලකුණු 99 යි. මේ රටේ අහිංසක දරුවෝ මේ නීති විද්‍යාලයට එන්න තරග විභාගයට මුහුණ දීලා, පාඩම් කරලා බොහොම අමාරුවෙන් ඇවිල්ලා, භාෂා ප්‍රශ්නවලට මුහුණ දීලා, බොහොම අමාරුවෙන් විභාගය කරද්දී මේ රටේ ජනාධිපතිවරයාගේ පුතාට පුළුවන් වෙලා තිබෙනවා, AC කාමරයක ඉඳන් ඔය කියන නීති විද්‍යාලයේ විභාගය ලියන්න. ඉතාම කනගාටුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතකොට මේකේ ගැටළු කිහිපයක් තිබෙනවා. මම ඉදිරිපත් කරන්නම්. දැන් මේ වයස ප්‍රශ්නය. මේ වයස ප්‍රශ්නය පසුගිය රජය කාලේ වතාවල් තුනක් ආවා. වයස සීමාව 35 කළා. ඊට පස්සේ දැන් වයස සීමාව 30 කරලා තිබෙනවා. ලෝකයේ කිසිදු නීති විද්‍යාලයක වයසක් නැහැ. හැබැයි, ලංකාවේ වයසක් තීරණය කරලා තිබෙනවා. ඒක විටෙක වයස අවුරුදු 30 වෙනවා. විටෙක අවුරුදු 35 වෙනවා. තවත් විටෙක මේ වයස් සීමාව ඉවත් කරපු කාල සීමාවලුත් මේ නීති විද්‍යාලයේ තිබෙනවා. එතකොට තමන්ගේ කට්ටිය විභාගයකට ඉන්න කොට, තමන්ගේ කෙනාට වයස දිහා බලලා තමයි මේ නීති විද්‍යාලයේ ප්‍රතිපත්තිය තීරණය කරන්නේ. කනගාටුයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. නීති විද්‍යාලයට එක්තරා කාලයක ළමුන් 225 ක් බඳවා ගත්තා. හැබැයි, 226 වැනියාට ඉන්නවා එක්තරා ඇමතිවරයකුගේ පුතෙක්. ගත්තා බැජ් දෙකක්. එතකොට මම කියන්නේ, කවුරු කළත් මේක වැරැද්දක්. එතකොට මේකේ ප්‍රතිපත්තියක් නැහැ. ප්‍රතිපත්තියක් තීරණය වෙන්න ඕනෑ.

මම කියන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි වයස පිළිබඳ ප්‍රශ්නය. ඊට පස්සේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නීති විද්‍යාලයට බඳවා ගැනීමේදී ප්‍රශ්න පත්‍රය. සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න පත්‍රයක් තමයි දෙන්නේ. නමුත් ප්‍රශ්න පත්‍රය පිළිබඳව ගැටළු ඇති වෙලා තිබෙනවා. එතකොට නීතිඥවරයෙක් වෙන්න නම් ඊට අදාළ දැනුමක් තිබෙන කෙනෙක් බවට පත් වෙන්න එයට Background to the law. එහෙම ප්‍රශ්න පත්‍රයක් තමයි නිර්මාණය විය යුතුව තිබුණේ. නමුත් නීති විද්‍යාලයේ ප්‍රශ්න පත්‍රය පිළිබඳව ලොකු ආන්දෝලනයක් තිබෙනවා. ඒ ගැටළුවත් විසඳිය යුතු කාරණයක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නීති විද්‍යාලයේ සනාථන සභාවේ ලොක්කා හැටියට ඉන්නේ අග්‍රවිනිශ්චයකාරවරයා. එතකොට මේ අග්‍රවිනිශ්චයකාරවරයා ඉන්නා තුරු, අග්‍රවිනිශ්චයකාරවරයා හෝ වරිය මේකේ ඉන්නා තුරු මේ නීති විද්‍යාලයේ තිබෙන ගැටළු සම්බන්ධයෙන් කිසිදු නඩුකරයක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගෙනියන්න බැහැ. ගෙනියන්න පුළුවන්. ගෙන ගියාට ඒකට ලැබුණු ප්‍රතිඵලයක් නැහැ. දැන් නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කියපු අර නීති ශිෂ්‍යයා. නීති ශිෂ්‍යයා නඩුවක් විධියට නාමල් රාජපක්ෂ මහත්තයාගේ නඩුව අරන් ගියා. හැබැයි, මේ ඉන්න ශ්‍රේෂ්ඨාධිකරණය එය ඇහුවේ නැහැ. අහන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. අදාළ වාතාවරණයක් තිබුණේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා සනාථන සභාවේ සභාපතිවරයා බවට පත් වෙලා තිබෙනවා. එතකොට මේ ශිෂ්‍යයාට මොකක්ද වුණේ? නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා සම්බන්ධයෙන් කරපු පැමිණිල්ලට අදාළව රට දාලා යන්න සිද්ධ වුණා. මුලින්ම එංගලන්තයට ගියා. ඊට පස්සේ ස්විස්ටර්ලන්තයට ගියා. දැන් බොහොම අමාරුවෙන් ජීවිතය ගැට ගහ ගන්නේ. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා කියන්න පටන් ගත්තා මෙතැන තිබෙන සාධාරණය සහ අසාධාරණය. එතකොට ශ්‍රේෂ්ට නීතිඥවරයෙක් ගැන කිව්වා නේ. විජයදාස ලියනආරච්චි මහත්මයා. ඇත්තෙන්ම විජයදාස ලියනආරච්චි මහත්මයා තරම් මේ රටේ මානව හිමිකම් පිළිබඳව (බාධා කිරීම්) පොඩ්ඩක් ඉන්නකෝ. තපුල්ලන්න එපා. මම මේ කියන්නේ ඒක ගැන. මම මේ එතුමාගේ ගුණ වර්ණනාව මේ කියන්නේ. එතුමා තමයි කිසිම පාට පක්ෂ භේදයකින් තොරව මේ රටට මානව හිමිකම් පිළිබඳව -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

කොන්ද කෙළින් තියාගෙන කියන්න. බටලන්දේ මැරුවා කියලා කෙළින් කියන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඉන්න කලබල නැතිව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

හැමදාම ඕක නේ කියන්නේ. අලුත් දෙයක් කියන්න. පරණ තැටි දාලා වැඩක් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එතකොට මේ ශ්‍රේෂ්ට නීතිඥවරයා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා මූලාසනය අමතන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ආණ්ඩුවේ හිටියා නේ. දිනේෂ් ගුණවර්ධන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ශ්‍රේෂ්ට නීතිඥවරයාව පසුගිය කාල වකවානුවේ ඝාතනයට ලක් වුණා. හැබැයි, ඝාතනයට ලක් වුණාට පස්සේ - දැන් මෙතුමා චෝදනාවක් ඉදිරිපත් කරනවා. ඒක ඇත්ත. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ශ්‍රේෂ්ට නීතිඥවරයාව ඝාතනය කරන්න එයා ඉන්න තැන්, එයා සැඟවුණු තැන්, එයා හිටපු තැන් පිළිබඳව ඔත්තුව දීපු කෙනෙකුත් ඉන්නවා. ඒ ඔත්තුව දීපු කෙනා ගැන කියන්න. හිනා වෙවී ඉන්නේ නැතිව, ඝාතනය කරන්න ඔත්තුව දීපු කෙනා කියන්න. මරන්න ඔත්තුව දුන්නේ කවුද? විවෘතව කියන්න. (බාධා කිරීම්) විජයදාස ලියනආරච්චි සහෝදරයාව ඝාතනය

[ගරු සුනිල් වටගල]

කරන්න ඔත්තුව දුන්නේ කවුද කියන්න? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත් කනගාටුදායකයි මේවා. ශ්‍රේෂ්ට ඉතිහාසය මකන්න බැහැ. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කරන්න එපා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ශ්‍රේෂ්ට නීතිඥ මහත්වරුන්ට අපහාස කරන්න බැහැ මෙතුමන්ලාට. එතකොට ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය ගත්තාට පස්සේ මේ තිබෙන නීති විද්‍යාලයට අදාළ ගැටළු සාකච්ඡා කළ යුතුව තිබෙනවා. අද නීති විද්‍යාලය පසුගිය කාල වකවානුවේ මොනතරම් ම්ලේච්ඡ වුණාද කියනවා නම්, නීති විද්‍යාලයට දරුවෙකුට සෙරෙප්පු දෙකක් දා ගෙන යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. සෙරෙප්පු දෙක ගැලෙව්වා පඩිපෙළ ළඟදී. එහෙම පාලන අධිකාරියක් පත් කර ගත්තේ පසුගිය කාලයේදී. ඒ තරම් අන්ත තුච්ඡ විධියට ළමයින්ට සැලකුවේ. සිංහල භාෂාවෙන් ඉගෙන ගත්ත ළමයින්ට ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රශ්න පත්‍රය දෙන්නේ. දැන් මෙතැන කියැවුණා. ද්‍රවිඩ භාෂාවෙන් ඉගෙන ගත්ත ළමයින්ට ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රශ්න පත්‍රය දෙනවා. මෙගොල්ලන්ගේ ආණ්ඩුව කාලයේ ඒ තරම් තුච්ඡ විධියට මේ නිති විද්‍යාලයට සලකන්න ගත්තා. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ඉතාම අසාධාරණ තත්ත්වයක්. පාට පක්ෂ භේදයකින් තොරව මේ නීති විද්‍යාලයේ සම අයිතියක් සහිතව සිංහල ශිෂ්‍යයාට, ද්‍රවිඩ ශිෂ්‍යයාට, මුස්ලිම් ශිෂ්‍යයාට ඉගෙන ගන්න පුළුවන් වාතාවරණය හදන්න ඕනෑ. එහෙම නැතිව ලොකු ලොකු මහත්වරුන්ගේ ළමයින්ට එන්න වෙන කොට එයාගේ වයස දිහා බලලා, එයාගේ තරාතිරම දිහා බලලා, නීති විද්‍යාලයේ ප්‍රතිපත්ති හදන්න එපාය කියන එක අපි මේ අවස්ථාවේදී කියනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සියල්ල ගත්තාට පස්සේ අපි දැක්කා පසුගිය කාලයේ මේ ඉන්න වගකිවයුතු මහත්වරුන්, අපි කවුරුත් ආදර්ශවත් වෙන්න ඕනෑ. එහෙම ආදර්ශවත් නොවුණොත් විශේෂයෙන්ම අධිකරණ ඇමතිවරයාට පවා අපි ආරාධනා කරනවා. අධිකරණ ඇමතිවරයාට අපි මූලිකවම කියනවා. මේ නීති විද්‍යාලයේ ප්‍රශ්නයට මැදිහත් වෙන්න. එතකොට අධිකරණ ඇමතිවරයා ඇත්ත වශයෙන්ම නරක ආදර්ශයක් පෙන්වනවා නම් - මම කියන්නේ, දැන් සමහර චූදිතයෝ බලන්න අධිකරණ අමාත්‍යවරයා බන්ධනාගාරයට යනවා. හැබැයි, ඊට පහුවෙනිදාට සමහර චූදිතයන්ට ඇප ලැබෙන එක සම්බන්ධයෙන් ගැටළුවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මෙන්න මේ සම්බන්ධයෙන් අපි සැලකිලිමත් විය යුතුයි. අග්‍රවිනිශ්වයකාරවරයා. ඒ වාගේම අධිකරණ ඇමතිවරයා. මේ සියලු දෙනා එකතු වෙලා මීට අදාළ සෘජු මැදිහත්වීමක් කරන්න ඕනෑ. මේකේ පංගුපේරුවක් නැතිව, පාට පක්ෂ භේදයකින් තොරව දුවන්න පුළුවන් නීති විද්‍යාලයක් බවට මේවා පරිවර්තනය කර ගත යුතු වෙනවා. එහෙම නැති තාක් කල් මේ විවේචන එල්ල වන එක වැළැක්විය නොහැකියි කියන යෝජනාව මම මේ අවස්ථාවේ කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.30]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැදගත් යෝජනාවක් මේ අවස්ථාවේදී සභාවට ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම නීති විද්‍යාලය සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වය කථා කරද්දී මේ නීති විද්‍යාලය නීති සනාථන සභාවක පාලනයට යටත් කරන්න හේතු වුණේ, රටක ඕනෑම පුද්ගලයෙක් යම්කිසි අසාධාරණයකට ලක් වුණාම යන්නේ අධිකරණයට. මේ අධිකරණය සම්බන්ධයෙන් කටයුතු කරන, අධිකරණයට සහාය වන නිතීඥවරු විභාගයකින් සමත් කරලා ඒ ක්ෂේත්‍රයට අවතීර්ණ කරන කොට එහි පූර්ණ ස්වාධීනත්වයක් ආරක්ෂා කිරීම අරමුණු කර ගෙන තමයි මේකට කිසිම දේශපාලන ඇඟිලි ගැසීමක් කරන්නේ නැතුව අධිකරණ ක්ෂේත්‍රයට ඒක භාර දීලා සනාථන සභාවක් පිහිටුවන්න යෙදුණේ. ඒ අනුව තමයි අග්‍රවිනිශ්වයකාරවරයාට එහි සභාපතිත්වයත් අනෙකුත් ධූරවලටත් දේශපාලනයට සම්බන්ධ නැති අය පත් කරලා එවැනි සනාථන සභාවක් ස්ථාපිත කළේ. නමුත් පසුකාලීනව සිද්ධ වුණේ, මේක නීති විද්‍යාලයට විතරක් ඇඟිල්ල දික් කරන්න පුළුවන් කාරණාවක් නොවෙයි. පසුකාලීන අධිකරණ ක්ෂේත්‍රය පුරාවටම දේශපාලන ඇඟිලි ගැසීම් සිද්ධ වුණා. මෙතැනදී පක්ෂයකට පටු කරගෙන, එහෙම නැත්නම් එක ක්ෂේත්‍රයකට පටු කරගෙන නොවෙයි අපි කථා කරන්නේ. මේ ශ්‍රී ලංකාවට ඉදිරි ගමනක්

තිබෙනවා නම්, විශේෂයෙන්ම මේ නීති ක්ෂේත්‍රයේ ගාම්භීරත්වය, ගරුත්වය ආරක්ෂා කරන්න ඕනෑ. නීති ක්ෂේත්‍රයට ප්‍රවේශවන නීතිඥවරු යම්කිසි හෙයකින් ලකුණු නැති අය විභාගයට ඇවිල්ලා, ලකුණු දාලා පාස් කරන්න ගත්තොත් ඒ අය ඇවිල්ලා නීති තර්ක ඉදිරිපත් කරනකොට නීතියේ අවසංකලනයක් සිද්ධ වෙනවා. මේ නිසා තමයි මේ ගාම්භීරත්වය ආරක්ෂා කිරීම රටට අවශ්‍ය වෙලා තිබෙන්නේ. පසුගිය කාලය පුරාවට අපේ ගරු මන්ත්‍රීතුමන්ලා වැදගත් අදහස් ප්‍රකාශ කළා. සමහරු මේ අදහස ප්‍රකාශ කරන්නේ, මේ රටේ උන්නතිය සඳහා ඉදිරියට දකින්න ඕනෑ පියවරක් විධියට නොවෙයි. තව කෙනෙකුගේ අඩුපාඩු කියලා මඩ ගහන තත්ත්වයකට පත් කර ගන්න හදනවා. බටලන්ද කොමිසන් ගැන කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාවේ අවධානය යොමු කරන්නේ අවුරුදු 20 ක වාගේ පාලන කාලයක්, 1994 වාගේ ඉඳලා ආණ්ඩුවක් පවත්වාගෙන ආපු අය මොනවා හරි අසාධාරණයක් කාට හරි වෙලා තිබුණා නම්, ඕනෑම කෙනෙකුගේ අතින්. මේකේ කවුරුත් රජවරු නැහැ. ලොක්කෝ නැහැ. නීතියට යටත්ව ඒ අයට නීතිය ක්‍රියාත්මක කරන්න හැකියාව තිබුණා. ඒවා නොකර අද මේ වැදගත් මාතෘකාවක් කථා කරනකොට අරක ගැන, මේක ගැන කියලා වැඩක් නැහැ. දැන් අපි අපේ රජයක් පත් කරගෙන තමයි මේ ගැන කථා කරන්නේ. මේක කලින් රජය තිබියදී ඉදිරිපත් වෙනවා. අපි අද කථා කරනවා. අද රජයටත් අපි කියන්නේ, මේ නීතියේ ආධිපත්‍ය ඒ ගරුත්වය, ඒ පෞර්ෂත්වය අපි ආරක්ෂා කරන්න ඕනෑ කියන එක. විවාදයක් නැහැ. හැබැයි, දේශපාලනයට එන විවිධ අය වෙනත් උපක්‍රම මාර්ගයෙන්, වෙනත් ක්‍රමෝපාය මාර්ගයෙන් කොහොම හරි නීතියට ඇඟිලි ගහන්න හදනවා නම් ඒක වැළැක්වීම තමයි මේ සභාව විසින් මේ රජයට යෝජනා කරනු ලබන්නේ. යම්කිසි තැනක අඩුපාඩුවක් තිබෙනවා නම්, ඒ අඩුපාඩු පෙන්වා දීම මේ ජනයා නියෝජනය කරන්න පත් වුණු මහජන නියෝජිතවරුන්ගේ වගකීමක්. මේක වෙන්න ඇරලා ඉවර වෙලා වුණා කියලා පත්තරවල කියන්න, TV වල මුහුණ දාගන්න, ජනමාධ්‍ය හරහා ප්‍රසිද්ධියක් ලබා ගන්න කියන කථාවකට පරිවර්තනය කරගන්න යන එක නොවෙයි මේකේ වැදගත්කම. මේකේ වැදගත් අරමුණට අපි ළඟා වෙන්න පුළුවන්ද කියන තැනටයි අපි යන්න ඕනෑ. ඒක පුළුවන්. බැරි දෙයක් නොවෙයි. මේ දේ අපි කරන්න අවශ්‍යයි. ඒක වැරැදි දෙයක් නොවෙයි. ඒත් එක්කම විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ.

මෙහිදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අද මේ රටේ නීති විද්‍යාලයේ ආධිපත්‍ය ගැන කථා කරන අපි මේ සභාවේ ආධිපත්‍ය ගැන බැලුවොත් අද බලන්න කොපමණ සීට් ප්‍රමාණයක් හිස් වෙලා තිබෙනවාද කියන එක. මේ මහජනතාවගේ මුදල් වියදම් කරලා මේ සභාවල් රැස් කරන්නේ. පාර්ලිමේන්තුවත් එහෙමයි. මේ සභාවත් එහෙමයි. යම්කිසි වැදගත් විවාදයක් කරන කොට ඒවාට සහභාගී වෙන්නේ නැහැ. මඩ ගහන්න විතරයි මේ සභාව පාවිච්චි කරන්නේ. සමහරුන්ට නින්ද යනවා. මෙහෙම නිදාගන්න ඇමැතිවරු ඉන්න රටක අපට යහපාලනයක් බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ නිසා නිදා ගන්න ඇමැතිවරු ඉන්න මේ පළාත් සභාවේ බලයත් අපි ලබන සැරේ ගන්නවා. එතකොට ඔය නිදාගන්න එන්නේ නැහැ. ඒ නිසා මා ඉතාම ගෞරවයෙන් මේ සභාවේ අවධානය යොමු කරන්නේ, මේ ශිෂ්‍යයින් බඳවා ගන්න විභාගයේ ඉඳලා, මේ ශිෂ්‍යයින්ගේ භාෂා පිළිබඳ ප්‍රශ්නයේ ඉඳලා, වයස් පිළිබඳ ප්‍රශ්නයේ ඉඳලා දක්ෂතාවය තිබෙන ඕනෑම කෙනෙකුට ඒ විභාගයට මුහුණ දීමේ හැකියාව තිබෙනවා නම් ඒ සඳහා අවස්ථාවක් දෙන්නට ඕනෑ. විටින් විට නීතිය වෙනස් කරමින් තමන්ට ඕනෑ ආකාරයට කටයුතු කරන, බලපෑම් කරන දේශපාලන බලපෑම් සියල්ල ඉවත් කරලා යම්කිසි විනිශ්චයකාරවරයෙක් හරි දේශපාලන බලපෑමකට යටත් වෙලා ඉන්නවා නම් ඒ සියල්ල ඉවත් කරලා මේ ස්ථානය ස්වාධීන කිරීම, මේ නීති සනාථන සභාවේ පරිපාලනය යථාවත් කිරීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු දෙයක් හැටියටත් - නිල්, රතු, කොළ කුමන පක්ෂයක් බලයට පත් වුණත්, මේ නීති සනාථන සභාවේ ගරුත්වය ආරක්ෂා වන ආකාරයට මෙහි කටයුතු විධිමත් විය යුතුයි කියන එක යෝජනා කරමින් මේ සඳහා මගේ සහාය පළ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 12.36]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නීතියේ තිඹිරි ගෙය, නීතියේ මව්කුස නිවැරැදිව නොවුණොත් එහෙම නීතියේ මව්කුසින් බිහි වන දරුවා අධිකරණයට ඇවිල්ලා, අධිකරණයේ නීතිඥවරයෙකු විධියට කටයුතු කරද්දීම, ඒ කාරණය තුළම රටට, පුරවැසියන්ට, අපට, ඔබට, මට අත්වන ඉරණම පසුගිය කාල වකවානුව පුරා විවිධ නඩු තීන්දු සහ අධිකරණ සිද්ධි තුළ දකින්න අවස්ථාව ලැබුණා.

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

ඒ නිසා නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ මේ කාලීන යෝජනාව පසුගිය රජය බලය අවසන් කරපු මොහොතේ වුණත් මේ රජයටත් ඒ ආකාරයටම තවමත් වලංගුව පවතින කාරණයක් බව අපි විශ්වාස කරනවා. තවමත් මේ ක්‍රමවේදය තුළ නීති විද්‍යාලයේ පරිපාලනය සහ නීතිඥවරු බිහි වීමට බලපාන ප්‍රධාන මූලික කාරණා ඇතුළත තිබෙන කාරණාවලට ස්ථිරසාර නිවැරදි විසඳුමක් නොලැබී තිබෙන තත්ත්වයක් තමයි දක්නට තිබෙන්නේ. ප්‍රධාන වශයෙන්ම අපේ සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට මොළේ තියෙන කොට බලය නැහැ, බලය තියෙන කොට මොළේ නැති තත්ත්වයක් තමයි මට එතුමාගේ කථාව තුළ පේන්න තිබුණේ. එතුමාට ඔය තිබෙන උවමනාවත්, අදහසත්, හැඟීමත් එතුමාගේ ඇමැතිවරයා කැබිනට්ටුව නියෝජනය කරන කාල වකවානුවේ තිබුණා නම්, අද මීට වඩා හොඳ නීති විද්‍යාල පරිපාලනයක් තුළ මේ කටයුතුවලට අපට සහ වෙනත් අනෙකුත් කටයුතු තුළ දකින්න ලැබෙන්න තිබුණා. කොහොම වුණත්, අද නීතියේ ආධිපත්‍යයත් ඒ විශ්වාසයත් රැකෙන්නට නීති විද්‍යාලයේ කාර්ය භාරය ඉතා වැදගත් කොට සලකන්න ඕනෑ.

අද මේ අවස්ථාවේ අදහස් පළ කරපු අපේ ගරු මන්ත්‍රීවරු සඳහන් කරපු ආකාරයට කාරණා කිහිපයක් මේ තුළ තිබෙනවා. මේ නීති විද්‍යාලය ඇතුළේ, නීති විද්‍යාල විභාගයට වසරකට ළමුන් 10,000 ක් හෝ 15,000 ක ප්‍රමාණයක් අයදුම් කරනවා. නීති විද්‍යාලය සඳහා පමණක්. ඊට අමතරව විවෘත විශ්ව විද්‍යාලයේ LLB උපාධි පාඨමාලාව හදාරන්නට ළමුන් 10,000 ත් 15,000 ත් අතර ප්‍රමාණයක් නීති විද්‍යාලයට ඇතුළත් වීමේ තවත් ගමන් මගක් විධියට ඒ කටයුත්තට දායක වෙනවා. කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙන් තවත් ප්‍රමාණයක් එනවා. ඒ වාගේම London LLB කරලා තවත් ප්‍රමාණයක් එනවා. මේ ඔක්කෝගේම අවසාන ප්‍රතිඵලය නීතිඥවරයෙක් විධියට එළියට එන්නේ නීති විද්‍යාලය ඇතුළේ පවත්වන අවසාන විභාගයේ සමත් වීමෙන් පස්සේ. ඒ නිසා වර්ෂයකට නීති ක්ෂේත්‍රයට ඇතුළත් වන නීතිඥවරු සංඛ්‍යාව අතිවිශාල ප්‍රමාණයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ පත් වන නීතිඥවරු මොනතරම් ගුණාත්මක සහ දැනුමෙන් පරිපූර්ණ, විනයෙන් පරිපූර්ණ, වෘත්තියට ගැළපෙන වෘත්තීය ආචාර ධර්මත් එක්ක බැඳුණු පිරිසක්ද කියන එක අතිශයින් මේ වෘත්තීය අනාගත පැවැත්ම උදෙසාත්, මේ වෘත්තියේ අනාගත පැවැත්ම මත රටේත්, සමාජයේත් නීතියේ යහපාලනය උදෙසාත් අතිශයින් වැදගත්කමක් දක්වනවා. මේ ඉදිරිපත් වුණු කාරණා තුළ රටේ පාලකයාට, රටේ නායකයාට විශාල වගකීමක් තිබෙනවා, මේ ආයතන පිළිබඳව මනා සංයමයකින් සහ විනයවත්ව කටයුතු කරන්න.

අපි පසුගිය කාලය පුරා දැක්කා, මේ රටේ ප්‍රධාන පුරවැසියා වුණු තැනැත්තන්ගේ දරුවෝ, තමන්ගේ දරුවෝ මේ රටේ ප්‍රධාන ආයතනයට ඇතුල් වෙන්නේම අනීතික ක්‍රමවේද භාවිතා කරලා. තමන්ගේ අසීමිත වූ රාජ්‍ය බලය පාවිච්චි කරලා. එක දරුවෙක් නාවික හමුදාවට යනවා. නාවික හමුදාවට යන්නේ, සම්පූර්ණයෙන්ම නීතියෙන් නියම කරලා තිබෙන මූලික සුදුසුකම්වත් අනුගමනය කරන්නේ නැතුව. එක දරුවෙක් නාවික හමුදාවට යනවා රටේ පුරවැසියාගේ තිබෙන දේශපාලන හයිය පාවිච්චි කරලා. අද ඒක ගැටළුකාරී බවට පත් වෙලා තිබෙනවා. ආරක්ෂක හමුදාවකට ඇතුළත් වීමේදී අනුගමනය කළ යුතු, ඒ පුරාතනයේ ඉඳලා පැවැතගෙන එන සම්ප්‍රදායන්වලට පටහැනිව එක දරුවෙක් ඇතුළත් කරනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අනෙක් එවුන් රට යනකොට එකෙක් යනවා හමුදාවට.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කරදර කරන්න එපා. අනෙක් දරුවාව නීති විද්‍යාලයට එවනවා. ඒ නීති විද්‍යාලයට එවන දරුවාව එවන්නෙත් ඒ විධියටම අනීතික ක්‍රමවේද භාවිතා කරලා. ඒ අනීතික ක්‍රමවේදය භාවිතා කරලා දෙවැනි දරුවා නීති විද්‍යාලයට එවනවා. තුන්වැනි දරුවා යවනවා ගගනගාමියෙක් කරන්නට. රටේත් සල්ලි විනාශ කරලා. දරුවෝ තුන්දෙනාටම රටේ ප්‍රධාන පුරවැසියා මේ නීතියේ තිබෙන සම්ප්‍රදායන්, නීතියේ තිබෙන පාලනය බිඳ වට්ටලා නීතියෙන් පිට ගිහිල්ලා අනීතික විධියට තමන්ගේ දරුවන්ට සලකන පාලකයෝ බිහි වුණු නිසයි නීති විද්‍යාලයටත්, නීති විද්‍යාලයෙන් පිට වන දරුවන්ටත් අද මේ තත්ත්වය ගැන කථා කරන්න උදා වෙලා තිබෙන්නේ. දැන් මොකක්ද වුණේ? නාමල් රාජපක්ෂ කියන නීතිඥවරයා විභාගය

ලියන්නේ නීති විද්‍යාලයේ රෙගුලාසි 60 සඳහන් වෙනවා කිසිම නීති ශිෂ්‍යයෙකුට, විභාග අපේක්ෂකයෙකුට හැකියාවක් නැහැ පරිගණක, ලියකියවිලි, පොත්පත් පාවිච්චි කරමින් විභාගය ලියන්න. හැබැයි නාමල් රාජපක්ෂට විභාගය ලියන්න පරිගණකයක් දෙනවා. නාමල් රාජපක්ෂ විභාගය ලියන්න එනකොට නීති විද්‍යාලයේ විදුලිහල්පති බුලත් අතක් දීලා පිළිගන්නවා. AC කාමරයට අරගෙන යනවා. AC කාමරයේ ඉඳලා Computer එකක් තියාගෙන නාමල් රාජපක්ෂ විභාගය ලියනවා. ලකුණු 99 යි. ඊට පස්සේ නාමල් රාජපක්ෂ දිවුරුම් දෙන්න එනවා. නාමල් රාජපක්ෂ දිවුරුම් දෙන්නේ කොහොමද? අපි දිවුරුම් දීපු විධියට ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දෙන්නේ නැහැ. නාමල් රාජපක්ෂ දිවුරුම් දෙන්නේ -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. පාර්ලිමේන්තුව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ හැසිරීම සහ -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම පාර්ලිමේන්තු මන්ත්‍රී ගැන නොවෙයි කියන්නේ. මම කියන්නේ නීතිඥ නාමල් රාජපක්ෂ ගැන.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔහුගේ ඒ විලාශය පිළිබඳ මේ සභාව තුළ සාකච්ඡා කිරීම, ඔහුගේ ආකල්ප පිළිබඳව කථා කිරීම මේ රීතිය අනුව පටහැනියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මන්ත්‍රී ධූරය ගැන කිව්වේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ, නැහැ. නීතිඥවරයා ගැන කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මාතෘකාවට අනුව කථා කරන්න ඒ ගැන සැලකිලිමත් වෙලා. නම නොකියා කථා කරන්න. නම පාවිච්චි කරන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

රීති අංක 68 අනුව -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සිසිර ජයකොඩි සංවිධායකතුමා බරපතළ චෝදනාවක් කළා රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නමට. ඔය පුටුව සැලුනේ නැහැ. ඔය පුටුවට රිදුණේ නැහැ. ඔය පුටුවට වැදුණේ නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

රීතිය මතක තියාගන්න. කරුණාකරලා ඔබතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ හැසිරීම සහ ඒ පිළිබඳව කථා කිරීම රීත්‍යානුකූල පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් විවේචනය නොකර, නම පාවිච්චි නොකර ඔබතුමා කථා කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම කොයි වෙලාවකවත් මගේ කථාව ඇතුළේ පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ කියලා මම කියලා නැහැ. නීතිඥ නාමල් රාජපක්ෂ කියන නීති විද්‍යාලයෙන් බිහි වුණු නීතිඥවරයා ගැන මම මේ කියන්නේ. (බාධා කිරීමක්)

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

තවම රාජපක්ෂලාට භයයි නේද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම දන්නේ නැහැ පාර්ලිමේන්තුවේ නාමල් රාජපක්ෂ කෙනෙක් ගැන. මම දන්නවා අපේ වෘත්තියේ ඉන්නේ නීතිඥ නාමල් රාජපක්ෂ ගැන. මම දන්නේ එහෙම කෙනෙක්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගෙන් අපට අවසර ලැබෙන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ ඉන්න අයගේ නමින් කථා කරනවා. නමින් කථා කරලා චෝදනා කරනවා. නමින් කථා කරලා චෝදනා කළාම මේ ප්‍රතිපත්තිය අනුව අපටත් ඒ අවස්ථාව තිබෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ ගරුත්වය රැකෙන්න ඕනෑ ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා ඔබතුමා නම් පාවිච්චි නොකර කථා කරන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

අපි කථා කරනවා. අපි නම කියලා කථා කරනවා. (බාධා කිරීම්) රවී කරුණානායක ඒ ආදී වශයෙන් අපි නම කියලා කථා කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නාමල් රාජපක්ෂලා කිහිප දෙනෙක් ඉන්නවා. ජනාධිපතිවරණයටත් ඉදිරිපත් වුණා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේ වරප්‍රසාදය විපක්ෂයට දෙනවා නම්, ආණ්ඩු පක්ෂයටත් දෙන්න ඕනෑ. එක පැත්තකට විතරක් දෙන්න බැහැ. අපටත් එහෙම කථා කරන්න අයිතිවාසිකම තියෙන්න ඕනෑ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හරි, හරි දෙන්නම්. වාඩි වෙන්න කෝ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නීතිඥ රාජපක්ෂ කියලා කෙනෙක්, නීතිඥ එන්. රාජපක්ෂ කියලා කෙනෙක් නීති විද්‍යාලයේ විභාගය ලියනවා. නීති විද්‍යාලයේ විදුහල්පතිවරයා බුලත් දීලා පිළි අරගෙන කාමරයකට අරගෙන එයා දිවුරුම් දෙනවා. එයාට දිවුරුම් දෙන්න විශේෂ වරප්‍රසාදයක් දෙනවා. අග්‍රවිනිශ්චයකාරවරයාගේ කාමරය ඇතුළේ නීතිඥ රාජපක්ෂට දිවුරුම් දෙන්න දෙනවා. මේ සම්බන්ධයෙන් නීති විද්‍යාලයේ ශිෂ්‍යයෙක් වුණු ඩී.එම්. තුෂාර විසින් පරීක්ෂණයක් ඉල්ලනවා. අවසාන ප්‍රතිඵලය වෙන්නේ ඩී.එම්. තුෂාරට ලංකාව දාලා යන්න වෙනවා. මරණීය තර්ජන නිසා. අන්න නැවත වතාවක් තුෂාර එළියට ඇවිල්ලා තිබෙනවා. 2015.02.09 වැනිදා ඒ කියන්නේ මේ අවුරුද්දේ පෙබරවාරි මාසේ 09 වැනිදා නැවත සාධාරණ පරීක්ෂණයක් ඉල්ලලා මේ එන්. රාජපක්ෂ කියන නීතිඥවරයා අනීතික විධියට බලය පාවිච්චි කරලා විභාගය ලියපු ක්‍රමවේදය පිළිබඳව නැවත පරීක්ෂා කරන්න කියලා ඉල්ලීමක් කරලා වර්තමාන අග්‍රවිනිශ්චයකාරතුමාට ලිපියක් භාර දීලා තිබෙනවා, මේ එන්. රාජපක්ෂ කියන නීතිඥවරයාගේ අයථා විභාග ලිවීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න කියලා. ඒ වාගේම මේ ක්‍රමවේදය තුළ සිසිර ජයකොඩි ගරු සංවිධායකතුමා කිව්වේ මොකක්ද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නැවත නැවත සිහිපත් කරනවා. මේ ක්‍රමවේදය අපි ඉදිරියේදී භාවිතා කරනවා. ඒකට ඔබතුමන්ලා අපට බාධා කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙපැත්තේම අයට මේ ප්‍රශ්නය භුක්ති විඳින්න වෙනවා. ඒ නිසා ඔබතුමා සභාවේ ගරුත්වය රැකෙන ආකාරයෙන් කටයුතු කරන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේ ක්‍රමවේදය තුළ අපටත් පුළුවන් රවී කරුණානායක කියලා කෙනෙක් සතොස කෑවා. සතොස විනාශ කළා. ඒවා අපි ඉස්සරහාදී කියන්නම්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

පිළිගන්නවා. බොහොම ස්තුතියි. ජගත් අංගගේ හිටපු ඇමැතිතුමාට බොහොම ස්තුතියි. ඇමැතිකමක් ලැබේවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මට ඇමැතිකම් ඕනෑ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2012 අවුරුද්දේ සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු අධිකරණ ඇමැතිවරයා විධියට රවුෆ් හකීම් ඇමැතිතුමා හිටපු අවස්ථාවේදී යම් ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ ඇති වන ප්‍රශ්නය තමයි නීති විද්‍යාලයට තෝරා පත් කර ගත්තු සිසුන් අතරින් 01 සිට 09 දක්වා සිසුන් අතර මුස්ලිම් තරුණ තරුණියන් වැඩි ප්‍රමාණයක් සිටීම. හැබැයි, ඒ ප්‍රශ්නයට ජාතිවාදය පටලවලා, වෙනත් ආකාරයකට ඒක ගෙන යන්න උත්සාහ කළාට CID එක විසින් කරන ලද පරීක්ෂණයේදී පැහැදිලි වෙනවා කොල්ලුපිටිය, වැල්ලවත්ත ප්‍රදේශයේ ස්ථානයකින් මේ ප්‍රශ්න පත්‍ර පෙර අවස්ථාවේ පිට වෙනවා කියන කාරණය පිළිබඳව. මෙහි තිබෙන තත්ත්වය, බරපතළතාවය තේරී පත් වන දරුවා සිංහලද, මුස්ලිම්ද, ද්‍රවිඩද කියන එක නොවෙයි. නීති විද්‍යාලය ඇතුළේ විභාග පටිපාටිය තුළ තිබෙන අක්‍රමික භාවය තුළ තමයි ප්‍රශ්න පත්‍ර පිට වෙන්නේ. එතකොට ප්‍රශ්න පත්‍රයක් පිට වන තරමට නීති විද්‍යාලයේ විභාග ක්‍රමවේදය අසාර්ථක නම් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමේ වගකීම පවතින රජයටත්, පවතින ඇමැතිවරයාටත් තිබෙනවා.

ඒ වාගේම 2013.06.20 වැනිදා නීති විද්‍යාලයේ විදුහල්පතිවරයාට පිහියෙන් අනින්න උත්සාහ කරන්න හැදුවා කියලා, මරන්න හැදුවා කියලා පසුගිය දවස්වල අපි දැක්කා. මේ ක්‍රමවේද ඔක්කෝමත් එක්ක එනකොට වසය අවුරුදු 30 ප්‍රශ්නය ඊළඟ ප්‍රශ්නය බවට පත් වෙලා තිබෙනවා. දැන් වයස අවුරුදු 30 ට. නීති විද්‍යාලයේ අතිරේක විදුහල්පතිවරිය ලිපියක් මඟින් දැනුම් දෙනවා 2014 අවුරුද්දේදී Notice Board එකේ දානවා මේ විභාගය ලිවීමේ වයස් සීමාව වයස අවුරුදු 30 ට අඩු කරනවා කියලා. සරත් එන්. සිල්වා මැතිතුමාගේ කාලයේ, 2012 දී වයස අවුරුදු 35 දක්වා මේක වෙනස් කරනවා. ඒ නිසා මෙහෙම යම් කෙනෙකුගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය වයස් සීමාවන්වලට කොටු කිරීම නුසුදුසු තත්ත්වයක් කියන එක මේ සභාවේ මේ යෝජනාවත් එක්ක පෙන්වා දෙන්න ඕනෑ. එය කෙනෙකුගේ අධ්‍යාපනය ලැබීමට, 12 (1) යටතේ කියන අයිතිවාසිකමට හානියක් බවටත් මේ තත්ත්වය පත් වෙලා තිබෙනවා කියන කාරණය සඳහන් කරනවා. ඒ වාගේම ඉතාමත් ගෞරවයෙන් සඳහන් කරන්නේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සඳහන් කළා ශිරාණි බණ්ඩාරනායක මැතිනියව ඉවත් කිරීම අනීතිකව සිද්ධ වුණා කියලා. ඉවත් කිරීම අනීතික වෙන්නේ පත් කිරීම නීත්‍යානුකූල වුණොත් විතරයි. ශිරානි බණ්ඩාරනායක ඉවත් කිරීම නීත්‍යානුකූල නොවුණු නිසා තමයි මොහාන් පීරිස් ඉවත් කිරීම නීත්‍යානුකූල නොවෙන්නේ. ඒ නිසා එතුමා දැන් උඩ යට මාරු වෙලා තිබෙන්නේ. එතුමා වෙන වෙන අරමුණුවල ඉන්න නිසා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල**
Hon. Udaya Prabhath Gammanpila

ඔබතුමාටත් දැන් උඩ යට මාරු වෙලා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ, මට මාරු වෙලා නැහැ. ශිරාණි බණ්ඩාරනායක පත් කිරීම නීත්‍යානුකූල වෙන්නේ නැහැ (බාධා කිරීමක්) ඔබතුමාට කොහොමත් උඩ යට මාරු වෙලා. උදේ හවස මාරු වෙලා. ඔබතුමාට තියෙන්නේ උදේ හවස මාරු වුණු ප්‍රශ්නයක්. උදේ ඉන්න එකේ නොවෙයි හවස ඉන්නේ. හවස ඉන්න එකේ නෙවෙයි උදේ ඉන්නේ. ඔබතුමාට ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා අපේ සහෝදර -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල**
Hon. Udaya Prabhath Gammanpila

ගොත ගහන්නේ නැතුව දැන් කථාව ඉවර කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ, ගොත ගහන්න දෙයක් නැහැ. ඔබතුමාට කියන්න වචනය තියෙනවා. ඔබතුමා ගෙම්බන්පිල වුණාට මම ගෙම්බන්පිල නොවෙයි නේ? මගේ සහෝදර මන්ත්‍රීතුමා ගෙනාපු මේ කාලීන වැදගත්කමකින් යුතු යෝජනාව නීති අධ්‍යාපනයත්, අධිකරණ ක්ෂේත්‍රයත් යහමඟට ගෙන යන්නට බලපාන යෝජනාවක් බව සඳහන් කරමින් එයට සහයෝගය පළ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.51]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුකොට මේ යෝජනාව හරහා නීතිඥ මහත්වරු හය හත් දෙනෙක් තමන්ගේ අදහස් මේ සභාවේ ප්‍රකාශ කිරීමට ලැබීමත් සතුටක් විධියට මම සලකනවා. අවංකවම මගේත් පොඩි කාලේ තිබුණා නීතිඥවරයෙක් වීමේ ආශාවක්. නමුත් සමහර නීතිඥ මහත්වරු මේ සභාවේ කථා කරපු විධිය දැක්කාම මම සතුටු වෙනවා මම බැංකුකරුවෙක් වීම පිළිබඳව. ඊට පස්සේ මම කොටස් වෙළඳ පොළට සම්බන්ධ වුණාම මට නැවත හිතුණා නීතිඥයෙකු වීමේ වැදගත්කම තියෙයි කියලා. ඒ වෙලාවේත් මගේ අතින් මේක මිස් වෙනවා. ඒ ගැනත් සතුටු වෙනවා. අන්තිමේදී දේශපාලඥයෙක් වුණාම අපි කිහිප දෙනෙක්ම දුක් වුණා, අපි හැම විභාගයක්ම කරන්න යනවා. ඇයි මේ නීති විභාගය කළේ නැත්තේ කියලා. ඒ ගැනත් දැන් පොඩි සතුටක් ලැබෙනවා. සමහර නීතිඥ මහත්වරු - මම කථා කළේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විජේදාස ලියනාරච්චි ගැන නොවෙයි. මම කථා කළේ නීති විද්‍යාලයේ සිංහලෙන් විභාගේ ලියලා යන පොඩි එකාට ඉංග්‍රීසියෙන් ප්‍රශ්න පත්‍රය දීලා සිංහලෙන් උත්තර ලියන්න කියන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කරන නීති විද්‍යාලය ගැන. මම කථා කළේ, විභාගය පටන් ගත්තාම ටොයිලට් ගියාම විනාඩි 30 ක් ළමයි එක ටොයිලට් එකේ හිටගෙන ඉන්න නීති විද්‍යාලය ගැන. පහසුකම් රහිත නීති විද්‍යාලය ගැන. නීති විද්‍යාලයේ ශිෂ්‍යයෙක්ට අධිකරණයට යෑමේ නොහැකියාව පිළිබඳව. අග්‍රවිනිශ්චයකාරියට විරුද්ධව නීති විද්‍යාලයේ ශිෂ්‍යයින්ට යන්න තැනක් නොමැතිවීම ගැන. නීති ශිෂ්‍යයින්ට තමන්ට අසාධාරණයක් කියන්න බැරුව රටෙන් පැනලා යන්න සිද්ධ වුණු එක ගැන. මම කථා කළේ, අර ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ගිහිල්ලා මහත්මා ගාන්ධිගේ ෆොටෝ එක එල්ලපු නීති විද්‍යාලය ගැන. මම කථා කළේ, ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ තාත්තා පළමුවැනි විදුහල්පති වුණු නීති විද්‍යාලය ගැන. නමුත් සමහර මන්ත්‍රීවරු කථා කළේ, මැදමුලනේ නීති විද්‍යාලය ගැන. තව සමහරු කථා කළේ - මම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලුවේ මේ යෝජනාව සභා සම්මත කරලා අපි සියලු මන්ත්‍රීවරු එකතු වෙලා මේක යෝජනාවක් විධියට දාලා නීති විද්‍යාලයේ ගිලිහී යන ගෞරවනීයත්වය පිළිබඳව දැනුවත් කරමුයි කියන්නයි. මෙතැන ඉන්න හැම මහත්මයෙක්ම හමුදාවේ සෙකන්ටඩ් ලෙෆ්ටිනන් අර කඩුව අරගෙන දියතලාවෙන් එළියට එනකොට ඉන්නවා වාගේ මේ නීතිඥ මහත්වරුන්ටත් අභිමානයක් තිබුණා නීති විද්‍යාලයෙන් ආවා කිව්වාම. පසුගිය කාලේ අර මම කියපු නීතියේ කන්‍යාවියගේ කන්‍යාභාවය විනාශ වීමත් එක්ක -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අභිසාරිකාවක් වුණා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඇය අභිසාරිකාවක් බවට පත් වුණා. ඒ නිසා මේක නිවැරුදි කරන්න බස්නාහිර පළාත් සභාව විධියට මේකට නායකත්වය සහ දායකත්වය අරගෙන යෝජනාවක් සම්මත කරලා අපි ආණ්ඩුවේ අධිකරණ අමාත්‍යවරයාට යොමු කරමු කියලා. නමුත් මේ යෝජනාව Orginaly මම භාර දීලා තිබුණේ, ගිය ආණ්ඩුව කාලේ. මම හිතන්නේ දැන් මාස 06 කට විතර උඩදී. දැන් මේක එනකොට සමහර ප්‍රශ්න සම්බන්ධයෙන් කෙටුම්පත් හදලා තිබෙනවා කියලා මට ආරංචි වෙලා තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ කොහොම වුණත් අපි බස්නාහිර පළාත් සභාව විධියට අපේ මේ සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ට වගකීමක් තිබෙනවා, ලංකාවේ වැඩියෙන්ම නීති විභාගයට වාඩි වෙන්නේ බස්නාහිර පළාතේ දරුවෝ. ඒ නිසයි මේ පිළිබඳව කථා කරන්නේ. නමුත් අපේ අර මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ මන්ත්‍රීවරු ප්‍රමාණය 20% ටත් අඩුද මන්දා. 25% ද මන්දා. තමුන්නාන්සේ සංවේදී නායකයෙක් නොවුණා නම් මේක කරන්න විධියක් නැහැ. ඒ නිසා අපි මේ යෝජනාව සම්මත කරලා යවමු.

මේ යෝජනාව ගෙන ඒමේදී තමන්ගේ නිහඬ බව දක්වමින් මේ යෝජනාවට ගරු කරපු උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාටත් මගේ ගෞරවයත්, ස්තූතියත් පිරිනමමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳ විවාදය අවසන් වෙනවා. මේ යෝජනාව සම්බන්ධව සභාවේ බෙදීමක් තිබෙනවාද?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම දැන් එළියට ගිහිල්ලා ආවා. එනකොට මට එන්න හම්බ වුණේ නැහැ එතැන ගැහැණු කෙනෙක් බෝඩ් එකක් එල්ලගෙන පොඩි පිකට් එකක් කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා කොහේද එහේ ගියේ?

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

මම උදේ ආහාරය ගන්න ගියේ. මේකේ කෑම හරි නැති නිසා මම මුං ඇට කන්න එළියට ගියා. මේකේ නැති නිසා. එනකොට මම ඒ ගෑණු කෙනාගෙන් මොකද කියලා ඇහුවාම ඒ ගැහැණු කෙනා මට අඩ ගහලා කිව්වා, මහත්තයෝ මෙහෙමයි, මගේ ළමයා පරිවාසයට අරගෙන තිබෙනවා. ඒ පරිවාසයට දාලා තිබෙන්නේ, කවුද මන්දා මට බොන්න කිරි එක්ක දුන්නා. ඒ කිරි එක බිව්වාට පස්සේ මට සිහිය නැති වුණා. පස්සේ මාව ඉස්පිරිතාලෙට ගිහිල්ලා දැම්මා.ඒ ගැහැණු කෙනා අනාචාරයේ යෙදෙනවාය, ගණිකා වෘත්තියේ යෙදෙනවාය කියලා, නඩු කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේකේ ඔබතුමාට වුණු -

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

මගේ ළමයෙක් නොවෙයි. පොඩ්ඩක් ඉන්න කියාගෙන යනවා. ඊට පස්සේ එහෙම කියලා කිව්වා පරිවාසයට හාමුදුරුනමක් පත් කරලා තිබෙනවා. ඒ හාමුදුරුවෝ පත් කරලා තිබෙන්නේ පළාත් සභාවෙන්ය. පළාත් සභාවෙන් පත් කරපු හාමුදුරුවෝ ළමයා දෙන්නේ නැහැ. ළමයාගෙන් දැන් වැඩ ගන්නවා කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඊ 12.00 ට Call දෙනවාලු.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ඔව්. ඊ 12.00 ට Call දෙනවාලු. ළමයාගෙන් වැඩ ගන්නවාලු. අම්මා මේ එළියේ ඉන්නවා. පළාත් සභා මන්ත්‍රීවරු කිහිප දෙනෙක් හම්බ වෙන්න ඕනෑ කියලා, මටත් කිව්වා. හරි නැහැ පළාත් සභාව ඉස්සරහාම ඉන්න එක. පාරේ ඉස්සරහා ඉන්නවා. වාහන ඔක්කෝගෙන්ම බල බලා යනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අදාළ අමාත්‍යාංශය වෙත යොමු කරන්න කටයුතු කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපේ රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා කියනවා මාව අල්ලගන්න එපා කියලා. සුමාන තුනක් තිස්සේ මෙතුමාව අල්ලගන්න බැරි වුණා. ඒ නිසා තමයි ඒ අම්මා එළියේ හිටගෙන ඉන්නේ.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

කථා කරලා කිව්වාලු. විලිලැජ්ජයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා දැන් මේකට අවස්ථාව දෙන්න බැහැ. යෝජනාව ගන්න වෙන්නේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට පැහැදිලි කිරීම් පිළිගන්න බැහැ. මෙතුමා මට පොරොන්දුවක් දීලා ඒ පොරොන්දුව කඩ කළා. ගරු ඇමැතිතුමා හෘද සාක්ෂියට එකඟව කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට විනාඩියක් දෙන්න.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ලැජ්ජයි. ඒ අම්මා එතැන ඇවිල්ලා බලාගෙන ඉන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේකට මම විරුද්ධයි. මේ සභාව නොමඟ යවන්න එපා ඇමැතිතුමා. ඔබතුමා සති තුනකට කලින් - මේ හතර වැනි සතිය. ඒ අම්මාව එදා නැගිට්ටෙව්වේ මම. ඔබතුමා මගෙන් ඉල්ලුවා නැගිට්ටවලා දෙන්න සහෝදරයා කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරන්න.

[සභාවේ ඝෝෂා]

සභාවේ එක එක දේවල් කරන්න බැහැ. න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, න්‍යාය පත්‍රයට යන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ කාලය සැලකිල්ලට අරගෙන දෙවැනි යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

තමුන්නාන්සේලට තියෙන්නේ තමුන්නාන්සේලාගේ න්‍යාය පත්‍ර. අපට තියෙන්නේ ජනතා න්‍යාය පත්‍ර. බොරුවට බයිලා ගහන්න එපා. ඇත්ත දැනගෙන කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

න්‍යාය පත්‍රයට අනුව වැඩ කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාලය දෙන්න බැහැ. අනවශ්‍ය දෙයක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මෙතුමාට ඒ ගැන කථා කරන්න දෙන්න එපා. එච්චරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව.

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II
PRIVATE MEMBERS' MOTION: II

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"බස්නාහිර පළාත තුළ මේ වන විට පාසල් දරුවන්ගෙන් දෙමව්පියන්ගෙන් විටින් විට මුදල් අය කිරීම සිදු වේ. පළමුවැනි ශ්‍රේණිය, හයවැනි ශ්‍රේණිය සහ දොළොස්වැනි ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මෙලෙස මුදල් එකතු කිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇත. එබැවින් බස්නාහිර පළාත තුළ පාසල් දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේ සභාවේ ගණපූරණය නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

යෝජනාව ස්ථිර කරලා ඉවරයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ කියන්නේ ඔබතුමන්ලා දෙමව්පියන්ගෙන් සල්ලි ගන්නවාට එකඟයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

මේ වනතුරුත් සභාවේ ගණ පූරණය සම්පූර්ණ නොවීම නිසා,

## රීති අංක 12 (1) යටතේ සභාව කල් තැබීම
ADJOURNMENT OF THE COUNCIL SITTING UNDER RULE NO. 12(1)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව ප.ව. 01.05 ට, 2015 මාර්තු මස 17 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 01.05 p.m till 09.30 a.m, on 17.03.2015.*